කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

# කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

පූර්ණ රජය සතු සමාගමකි

# වාර්ෂික වාර්තාව

## 2013 / 2014

**ප්‍රධාන කාර්යාලය**
100-1/3,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත,
කොළඹ 02
දුරකතන : 0112 - 388662
ෆැක්ස් : 0112 - 388663
විද්‍යුත් තැපැල : kgll@sltnet.lk
වෙබ්අඩවිය : www.kgraphite.lk

**පතල් කාර්යාලය**
කහටගහ පතල
මදුරාගොඩ,
දොඩන්ගස්ලන්ද
දුරකතන : 037-2252015
ෆැක්ස් : 037-4931711

# අ න් ත ර් ග ත ය


| | |
|---|---|
| හැඳින්වීම | 01 |
| සභාපතිතුමාගේ සමාලෝචනය | 02 |
| විගණන කමිටු වාර්තාව | 09 |
| ආයතනික දැක්ම, මෙහෙවර හා අරමුණු | 11 |
| සංවිධාන ව්‍යුහය | 12 |
| අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව | 13 |
| විශේෂ ගිණුම්කරණ තොරතුරු | 15 |
| වාර්ෂික ගිණුම් | 16 |
| රැස්වීම පිළිබඳ දැන්වීම | 17 |
| පෙරකලාසි ආකෘති පත්‍රය | 18 |

# හැඳින්වීම

‘‘කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්’’ සමාගම මගින් කළමනාකරණය කරනු ලබන කහටගහ පතල පිහිටා ඇත්තේ ශ්‍රී ලංකාවේ වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කොළඹ අගනුවර සිට ආසන්න වශයෙන් කිලෝමීටර් 90ක් පමණ දුරින් වූ මඳුරාගොඩ, දොඩන්ගස්ලන්ද ප්‍රදේශයෙහිය. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වන සම්පූර්ණයෙන් රජය සතු සීමිත වගකීම් සහිත සමාගමක් වන එහි කොටස් හිමිකරු වන්නේ මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයාය. විධායක සභාපතිවරයා ප්‍රධානකොට ගත් අධ්‍යක්ෂ මණ්ඩලය, කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් ආයතනයේ ප්‍රධාන ප්‍රතිපත්ති සම්පාදකයා වන අතර ආයතනික ප්‍රතිපත්තිවල හරය උකහාගන්නේ එහි රේඛීය අමාත්‍යාංශය සහ මහා භාණ්ඩාගාරයෙනි.

කහටගහ පතල මුහුදු මට්ටමේ සිට මීටර් 25ක් උසින් කඳුකර පෙදෙසක, නිදහස් අයිතියක් සතු, ආසන්න වශයෙන් අක්කර 102ක භූමි භාගයක පිහිටා තිබෙන අතර කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් සමාගම පරිහරණය කරනු ලබන්නේ මිහිපිට භූමියෙන් අක්කර සුළු ප්‍රමාණයකි. පතල, එහි පුළුල්ම ස්ථානයේදී මීටර් 500ක් තරම් දක්වා වූ දුරකට ව්‍යාප්ත වේ. ඊට අමතරව, අක්කර 102න් අක්කර 75ක වූ පොල් වගාවද ‘කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්’ සමාගම මගින් කළමනාකරණය කරනු ලබයි.

පතල් ආවාට දෙකක් මගින් ප්‍රවේශ විය හැකි අඩි 2000 (මීටර් 610) ක ගැඹුරකින් යුක්ත කහටගහ පතල වූ කලී ශ්‍රී ලංකාවේ ගැඹුරුතම පතලයි. කහටගහ පිහිටි එක් පතල් ආවාටයක් අඩි 1132 ( මීටර් 345 ) ක් වන අතර කොලොන්ගහ අඩි 330 (මීටර් 101 ) ක් දක්වා ගමන් කරයි. පහළ ඇති පතල් ආවාටයේ ප්‍රවේශය වන්නේ අඩි 2000 (මීටර් 610 ) ක් දක්වා වූ වින්ච් (winch) මාලාවකි. ප්‍රධාන වින්චිය ක්‍රියාකරවනු ලබන්නේ මිහිතුල කම්කරුවන් අඩි 1132 මට්ටම දක්වා ගෙන යාමටත්, අඩි 2000 මට්ටම දක්වා සේන්දුවීමටත්ය.

ශ්‍රී ලංකාවේ, බෝගල පතල සහ කහටගහ පතල යනුවෙන් නම්කර ඇති ප්‍රධාන පතල් දෙකකි. මීට පෙර, කහටගහ සහ කොලොන්ගහ පතල් දෙකක් වශයෙන් කටයුතු කරමින් සිටි අතර 1872 සිට මෙහෙයුම් කටයුතු සිදු කෙරුණි. එහෙත් වර්තමානයේ මෙම පතල් දෙක එක් පතලක් වශයෙන් ක්‍රියාත්මක වේ.

### කහටගහ අනන්‍ය වූ නිෂ්පාදන

ඉහළ කාබන් ප්‍රතිශතයකින් යුත්, ස්වභාවික ස්ඵටික ඉල්ලම් මිනිරන් ලොවට සපයන අනන්‍ය සැපයුම්කරු වශයෙන් ශ්‍රී ලංකාව ලොව පිළිගෙන ඇති අතර විශේෂයෙන්ම, කහටගහ පතල 99%ට වැඩි කාබන් ප්‍රතිශතයක් සහිත සම්පූර්ණයෙන් ස්ඵටික බවට පත්වූ ස්වරූපයෙන් පවතින ඉහළ පිරිසිදුභාවයකින් යුත් ස්වභාවික ඉල්ලම් මිනිරන් කැණීමේ හැකියාවක් සහිතය. එය ඉදිකටු වැනි සිහින් තුඩැති කූරු, කුට්ටි සහ පතුරු වශයෙන් දැකගත හැකි අතර අඩු භෂ්මීතිකතාවක් සහිත ඉහළ කාබන් ප්‍රතිශතයකින් යුත් ස්ඵටික ඉල්ලම් මිනිරන් වශයෙන් බහුලව පවතී. තවද, ලොව පිළිගත් අනන්‍ය නිෂ්පාදනයක් වශයෙන් ලෝක වෙළඳපොළෙහි කීර්තිනාමයක් තහවුරු කරගෙන තිබේ.

# ස භා ප ති තු මා ගේ  ස මා ලෝ ච න ය

අදාල ගිණුම් වර්ෂය තුල සමාගමේ කාර්ය සාධනය දෙස බැලීමේදී සැහෙන නිශ්චිත භාවයක් පෙනී යයි. එමෙන්ම පසුගිය දශක කිහිපය හා සංසන්දනාත්මකව බලන කල ස්වාභාවික මිනිරන් අපනයනයට වඩා කහටගහ මිනිරන් භාවිතා කරමින් අගය එකතු කරන ලද මිනිරන් නිෂ්පාදනයන් ඇති කිරිමෙහිලා වැඩි අවධානයක් යොමු කර ඇත.

## නිෂ්පාදනය



2013/2014 ගිණුම් වර්ෂයේදී සමාගම විසින් කණින ලද ස්වාභාවික මිනිරන් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 848 ක් වු අතර නිෂ්පාදනය හා සම්බන්ධව ඇස්තමේන්තුගත ප්‍රමාණය වු මෙට්‍රික් ටොන් 1000 හා සමඟ සසඳන කල ලබා ගත් මුළු නිෂ්පාදනය 85% කි. එහෙත් වර්තමාන වර්ෂයේ නිෂ්පාදනය පසුගිය වසරේ මෙට්‍රික් ටොන් 1018 ක් වු නිෂ්පාදනය හා සසඳන කල මෙම වසරේ මෙට්‍රික් ටොන් 170 ක් අඩු වී ඇති බව පෙනේ. වඩාත් ගැඹුරු මට්ටමෙහි කැණීම් සිදු කිරීම හා ඉහළ මට්ටමෙහි අධික කැණීම් හේතුවෙන් ඉල්ලම් අඩු වී යාම හා අධික වර්ෂාව හේතුවෙන් පිටතට ජලය පොම්ප කිරීමද 0.5% සිට 84.5% දක්වා වැඩි වීම මෙම නිෂ්පාදනය අඩු වීමට හේතු වී ඇත.



## විකුණුම්

අපනයනය සඳහා සැකසු මිනිරන් විකුණුම් ප්‍රමාණය පසුගිය වසර හා සසඳන කල මෙට්‍රික් ටොන් 537.8 සිට මෙට්‍රික් ටොන් 793.5 දක්වා වැඩිවීමක් ඇති අතර, මෙම වසරෙහි වාර්තාගත ආදායමක් වන රුපියල් මිලියන 144.11 පසුගිය වසරේ රුපියල් මිලියන 91.6 ක් වු ආදායම හා සැසදීමේදී එම ප්‍රතිශතය 57.2 ක වර්ධනයක් පෙන්නුම් කරයි. මෙම ආදායම ඉහල යාමට හේතු වී ඇත්තේ වැඩි කාබන් ප්‍රතිශතයකින් යුත් 97/99% හා 99+% වැනි ශ්‍රේණිවලින් යුත් මිනිරන් ඇමරිකා එක්සත් ජනපදය හා එක්සත් රාජධානිය වැනි රටවලට අපනයනය කිරීමයි. අප සමාගම සාමාන්‍යයෙන් අඛණ්ඩව සාම්ප්‍රදායික ගැණුම්කරුවන් වෙතම විකුණුම් කරනු ලබන අතර මිනිරන් සඳහා පවත්නා සුවිශේෂිත වෙළෙඳපොල මෙයට හේතු වී ඇත. වෙළෙඳපොල ස්ථායීතාව ඇති කර ගැනීම සඳහා අවධානය යොමු කරමින් වාණිජ අමාත්‍යාංශය හරහා විදේශ තානාපති කාර්යාලයන් මඟින් නව ගැණුම්කරුවන් සොයා ගෙන වෙළෙඳපොල වැඩි දියුණු කර ගැනීම සඳහා ද ප්‍රයත්න දරණ ලදී. එහෙත් එමඟින්ද සතුටුදායක ප්‍රතිචාරයක් නොලැබුණු බැවින් සමාගම තවදුරටත් සාම්ප්‍රදායික ගැණුම්කරුවන්ගේ වෙළෙඳපොල මතම රඳා පවතී.






## මූල්‍ය තත්වය

2013/2014 වසරේදී බදු ගෙවීමෙන් පසු ලාභය රුපියල් මිලියන 16.6 ක් වන අතර එය 2012/2013 වසරේදී රුපියල් මිලියන 15.6 ක් විය. අස්ථිර සහ ගැණුම්කරුවන් මත රඳා පවතින වෙළෙඳපොලක් වීම සමාගමේ ආදායම සහ ලාභය කෙරෙහි මහත් සේ බලපා ඇත. තවද පසුගිය වසරේ සිට සෑම හය මාසයකටම වරක් මිළ වැඩි කිරීමේ ක්‍රමවේදය ද ආදායම කෙරෙහි තදින්ම බලපාන ලදී. මිළ තීරණය කිරීමේ ක්‍රමවේදයේදී සුවිශේෂිත වෙළෙඳපොලක් ඇති මිනිරන් වෙළෙඳපොල පිළිබඳව ඉතා ප්‍රවේශමෙන් කටයුතු කල යුතු වේ.

පතල වැඩි දියුණු කිරීම, යටිතල පහසුකම් සහ යන්ත්‍රෝපකරණ ආදිය සඳහා රුපියල් මිලියන 31.3 ක ආයෝජනයක් සිදු කර ඇත.

සමාගමේ දල ලාභ අනුපාතය 63.39% ක් වන අතර ශුද්ධ ලාභ අනුපාතය 14.69% කි. 2013/2014 වර්ෂයේ සාමාන්‍ය ඵලදායීතාවය මිනිස් පැයකට කිලෝ 51 ක් විය. මේ හැර සමාගම විසින් පෙර වර්ෂය සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට රුපියල් මිලියන 10.0 ක් බදු ගෙවීමට එකඟ වී ඇති ඇත. 2013/14 ගිණුම් වර්ෂයේ බදු වගකීම රුපියල් මිලියන 4.58 කි. තවත් රුපියල් මිලියන 1.06 ක් ලාභාංශ වශයෙන් ගෙවීමට ඇත.

## මිහිතුල සංවර්ධන කටයුතු (පතල)



ඩයමන්ඩ් විදුම් යන්ත්‍රය භාවිතය හේතුවෙන් අඩි 1132 මට්ටමේදී ආර්ථිකමය වශයෙන් සඵලතාවයක් ඇත්තා වු ඉල්ලම් 06 ක් මතු වී ඇති අතර එහි සිට ඉහලට හා පහලට වැඩ බිම් කිහිපයක් ආරම්භ කරන ලදී. මිහිතුල නඩත්තු කටයුතු වැඩි දියුණු කර ඇති අතර වාතාශ්‍ර ලබා දීමේ කටයුතු ද ක්‍රමානුකූල කර ඇත. 1990 න් පසු මේ වසරේදී අඩි 1132 මට්ටමේ සිට අඩි 2000 මට්ටම දක්වා දෙවන ආවාටයක් කැණීම් කෙරෙහි අවධානය යොමු කර ඇත.



අඩි 1132 මට්ටමේ සිට අඩි 1280 මට්ටම දක්වා 2 වන ආවාට කැණීම් මූලික කටයුතු මෙම වසරේදී ආරම්භ කරන ලදී. ප්‍රධාන ආවාටය අඩි 1132 දක්වා පමණක් පැවති අතර අඩි 2000 මට්ටමේ සිට කණිනු ලබන මිනිරන් මිහිපිටට ගෙන ඒම ඉතා අසීරු මෙන්ම මිල අධික කාර්යයක් වී ඇත.



## සැකසුම් සහ ඇසුරුම් පද්ධතිය



ට්‍රොමල් (Trommel), කන්වේයර්ස් (Conveyers), ෂුට් (Chute), ආදී නවීන යන්ත්‍රෝපකරණ සැපයීමෙන් සැකසුම් අංශයේ ක්‍රියා දාමයන් ඉහළ නංවා ඇත. අවුරුදු 50-60 ක් පමණ කාලයක් පැරණි, මිනිස් ශ්‍රමයෙන් සැකසුම් කිරීම හා කාබන් වර්ග තේරීමට යොදා ගෙන තිබූ ගොඩනැගිල්ල කඩා ඉවත් කරමින් නවතම ගොඩනැගිලි පද්ධතියක් නිර්මාණය කිරීම හා නවීන වියළුම් අංගනයක් සහ ඇසුරුම් පෙට්ටි (Bin yards) ඇතුලත් ගොඩනැගිල්ල එකම ගොඩනැගිලි සංකීර්ණයක් වශයෙන් නිර්මාණය කරන ලදී. ඉහත කී ගොඩනැගිලි සැකසුම දෛනික මිහිතුල මිනිරන් නිෂ්පාදන ප්‍රමාණය මිහිපිටට ගෙන ඒම දක්වා එකම ක්‍රියා පද්ධතියක් බිහි කිරීමට උපකාරී වී ඇත. මූලික වෙන් කිරීමේ ක්‍රමයෙන් කොටසක් එමඟින් යාන්ත්‍රීකරණය වී ඇත. එමඟින් මිනිස් ශ්‍රම භාවිතයෙන් මිනිරන් තේරීම සඳහා වූ කාලය අඩු වීමෙන් ශ්‍රමයේ ඵලදායීතාවය වැඩි වී ඇත.





නවීන ගොඩනැගිලි සංකීර්ණය නිර්මාණය කරමින් සහ පවත්නා අනිකුත් ගොඩනැගිලි නවීකරණය කිරීමත් සමඟ කහටගහ පතල් භූමියෙහි සියලුම මාර්ග පද්ධතියන්ද නැවත ප්‍රතිසංස්කරණය කරන ලද හෙයින් මුළු පතල් භූමි ප්‍රදේශයම හොඳින් නඩත්තු වෙමින් පවතී.

ඇසුරුම් ක්‍රමය හා ඇසුරුම් ද්‍රව්‍යයන්ගේ තත්වයද වැඩි දියුණු කර ඇත.

### අගය එකතු කිරීම - අවසන් නිෂ්පාදන භාණ්ඩ සංවර්ධනය

(i) අනෙකුත් අදාල පර්යේෂණ ආයතන හා සම්බන්ධ වෙමින් කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම කහටගහ ස්වාභාවික මිනිරන් භාවිතා කරමින් කෝව නිෂ්පාදනය සඳහා මූලික පර්යේෂණ කටයුතු සිදු කර ඇත. එකී සාර්ථක පර්යේෂණ කටයුතු වලින් අනතුරුව ඉන්දියාවෙන් හා ජර්මනියෙන් ආනයනය කරන ලද කෝව හා බොහෝ දුරට සමාන වූ කාර්මික කෝව නිෂ්පාදනය කර ඇත.





කෝව වෙළෙඳපොල පිළිබඳව කරන ලද අපගේ මූලික නිරීක්ෂණයන්ට අනුව කෝව නිෂ්පාදනය රඳා පවතින්නේ දේශීය වාත්තු කර්මාන්තය හා ස්වර්ණාභරණ කර්මාන්තය මත බව පෙනී ගොස් ඇත. අවසන් නිෂ්පාදනයන් වශයෙන් කෝව නිෂ්පාදනය ගැන සලකා බලන කල්හි දැනට අප ආයතනය කෝව නිෂ්පාදනය කර ඇති අතර එය වාණිජ නිෂ්පාදනයක් වශයෙන් නිෂ්පාදන මට්ටමේ පවතී.

(ii) අවසන් නිෂ්පාදනයක් වශයෙන් කෝව නිෂ්පාදනයට අමතරව අගය එකතු කිරීමේ ක්‍රියාවලිය යටතේ කහටගහ සමාගම කොළඹ විශ්ව විද්‍යාලයේ විද්‍යා හා තාක්ෂණ අංශය සමඟ සම්බන්ධව අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට කටයුතු කර ඇත. එම අවබෝධතා ගිවිසුම අනුව කොළඹ විශ්ව විද්‍යාලයේ පහත සඳහන් නිෂ්පාදනයන් සංවර්ධනය සහ ක්‍රමවේදය එකී නිෂ්පාදන සඳහා ඉදිරිපත් කර ඇත.



- ✳ කන්ඩක්ටිව් කාබන් බුරුසු (මෝටර් සඳහා භාවිතය)
- ✳ මිනිරන් ග්‍රීස්
- ✳ මිනිරන් ගැස්කට්
- ✳ මිනිරන් කන්ඩක්ටින් මැලියම් (Glue)

## කන්ඩක්ටිව් කාබන් බුරුසු



මේ සඳහා කොළඹ විශ්ව විද්‍යාලයේ විද්‍යා හා තාක්ෂණ අංශය මූලික රසායනාගාර මට්ටමේ පර්යේෂණ කටයුතු අවසන් කර ඇත. අපගේ මූලික වෙළෙඳපොල සමීක්ෂණයට අනුව කාබන් දැනට විදුලි මෝටර් සඳහා භාවිතා කරනු ලබන කාබන් බුරුසු වර්ග 335 ක් ඇත. කහටගහ ග්‍රැෆයිට් සමාගම විසින් Floor polishers, Carpenter sanders සහ කන්ඩක්ටිව් බුරුසු නිෂ්පාදනය වාණිජ මට්ටමේ නිෂ්පාදනයන් සඳහා මූලික වෙළෙඳපොල සමීක්ෂණය සිදු කර ඇත.

## මිනිරන් ග්‍රීස් නිෂ්පාදනය




මෙම වසරේදී කොළඹ විශ්ව විද්‍යාලය මඟින් මිනිරන් ග්‍රීස් සම්බන්ධ මූලික පර්යේෂණ ප්‍රතිඵල අප සමාගම වෙත ලබා දී ඇති අතර සමාගම විසින් ප්‍රාථමික සාම්පල නිෂ්පාදනය කොට එහි තත්වය පරීක්ෂා කර බැලීම සඳහා කොළඹ විශ්ව විද්‍යාලය වෙත යවා ඇත. කිලෝ 250-500 අතර ප්‍රමාණයක් නිෂ්පාදනයට අපේක්ෂා කරනු ලබන අතර අවසාන ගැණුම්කරුවන්ගේ ක්‍රියාකලාපයද විමසා බැලීම මෙහිදී අපේක්ෂා කෙරේ.

## මිනිරන් ගැස්කට් නිෂ්පාදනය



කොළඹ විශ්ව විද්‍යාලය මඟින් රසායනාගාර මට්ටමේ පර්යේෂණ කටයුතු සාර්ථකව නිම කිරීමෙන් අනතුරුව මිනිරන් ගෑස්කට් අවසන් නිෂ්පාදනයක් වශයෙන් සංවර්ධනය කිරීම සඳහා එම පර්යේෂණ ප්‍රතිඵල ඉදිරිපත් කර ඇත. ගෑස්කට් නිෂ්පාදනයේ මූලික ක්‍රමවේදය වන්නේ ජලය උරා නොගන්නා විවිධ ඝණකම් ඇති කඩදාසි මත මැලියම් ඇතිරීමෙන් පසු එක හා සමාන පීඩනයකින් යුතුව සමතලා කොට ඒ මත විවිධ ඝණකමින් යුත් මැලියම් සහ සියුම් මිනිරන් කුඩු ආලේප කිරීමයි. මූලික උපකරණ ලබා ගැනීමෙන් අනතුරුව මෙම ගෑස්කට් නිෂ්පාදන මට්ටම දක්වා දියුණු කල යුතු වේ.

## මිනිරන් කන්ඩක්ටිව් ග්ලූ



***Joints made using graphite conducting glue***

කොළඹ විශ්ව විද්‍යාලය මඟින් ඉතා සරල ක්‍රියාදාමයක් වූ මිනිරන් ග්ලූ පර්යේෂණ කටයුතු අවසන් කර ඇති අතර මෙය කාර්මික සහ නිෂ්පාදන මට්ටමේ කටයුතු පිළිබඳ අධ්‍යයනය කරමින් සිටී.

ඝණ්ධමය ද්‍රව්‍ය එකිනෙකට යා කිරීම සඳහා මිනිරන් ග්ලූ යොදා ගන්නා අතර ඝණ්ධමය ද්‍රව්‍යයන් එකිනෙකට ඇලවීමෙන් පසු එහි ශක්තිමත්භාවය හා ස්ථායීතාවය ඇති කරන අතර මෙම ඇලවීම සඳහා ගන්නා ග්ලූ ප්‍රධාන වශයෙන් භාවිතා කරන්නේ ඉලෙක්ට්‍රොනික් කර්මාන්තයට අදාල නිෂ්පාදනයන් සඳහාය.

මෙම ග්ලූ නිෂ්පාදනය සඳහා මූලික අමුද්‍රව්‍ය වශයෙන් යොදා ගනු ලබන්නේ මිනිරන් සහ පොලිමර් ද්‍රව්‍යයන්ය.

## පොල් වගාව

කලකට පෙර අත්හැර දමා තිබූ පොල් ඉඩමේ අක්කර 52 ක පමණ ප්‍රමාණයක අළුතින් පොල් වගා කිරීම සිදු කර ඇත. දැනට මෙම පොල් වත්ත ඉතා හොඳින් පවත්වා ගෙන යන අතර සියලු යටිතල පහසුකම් හා පොහොර යෙදීම යනාදිය නිසි පරිදි කරනු ලැබේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් පැරණි වගාවේ පොල් ඵලදාව සෑහෙන ප්‍රමාණයකින් වැඩි වී ඇත.



## සේවක සබඳතාවය

සේවා සේවක සහභාගීත්ව කළමණාකරණය මඟින් සේවකයින්ගේ ජීවන තත්වය නංවාලීම සහ ඵලදායීතාවය ඉහළ නැංවීමට කටයුතු කර ඇත. මිහිපිට සේවකයින්ගේ සංස්කෘතික රටාව මිහිතුල සේවකයින්ගේ සංස්කෘතික රටාව සමඟ බලන කල්හි විශාල වෙනසක් දැකිය හැක. මේ සඳහා බෙහෙවින්ම හේතු වී ඇත්තේ මිහිතුල අවදානම් සහ අසීරු සේවා වතාවරණයන් මෙන්ම ඒ හා බැඳුණු ස්වභාව ධර්මයද හේතුවෙන් එම සේවකයන් තුල ඇති මානසික වතාවරණයයි.

සේවක ආරක්ෂණ හා සේවක ශුභසාධනය පිළිබඳව බැලීමේදී සියලුම කැණීම් හා සැකසුම් අංශ වල සේවකයින්ට වැළඳිය හැකි ග්‍රැෆයිට් නියුමකනෝසිස් නමැති කාර්මික රෝගය වැලැක්වීම සඳහා අදාල සියලුම සේවකයින්ට ලය විකිරණ වාර්තා (chest X-Ray) ලබා ගැනීමට කටයුතු කර ඇත. රිදීගම දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරී උපදේශය මත රිදීගම දිසා රෝහලේ වෛද්‍යවරයෙක් සතියකට වරක් පතලට පැමිණෙන අතර සියලුම සේවකයන්ට හා ඔවුන්ගේ දරු පවුල් වලටද අවශ්‍ය වෛද්‍ය සේවාවන් ලබා ගැනීමට කටයුතු සලසා ඇත. මේ සඳහා සමාගමේ වෛද්‍ය මධ්‍යස්ථානය භාවිතා කරන අතර මූලික වෛද්‍ය උපකරණ හා ඖෂධ වර්ගද ආයතනය මඟින් නොමිලේ සපයනු ලැබේ.



සේවකයින්ගේ අවශ්‍යතාවයන්ට අනුකූලව කැණීම් ආරක්ෂණ උපකරණ සහ ආරක්ෂණ නිල ඇඳුම් සපයා ඇත.

සමාගමේ මුළු සේවක සංඛ්‍යාව 120 ක් වන අතර එයින් 57 ක් මිහිතුල සේවය කරනු ලැබේ. ඉතිරි සේවක සංඛ්‍යාව නඩත්තු, සැකසුම්, හා පරිපාලන අංශයන්හි සේවයේ නිරතව ඇත.

පසුගිය වසරේ රුපියල් මිලියන 43.8 ක් වූ පිරිවැය හා සසඳන කල මෙම වසරේ සියලුම වැටුප් හා වේතන, පාරිතෝෂික දීමනා, සේවක අර්ථ සාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල් ආදී සියල්ල රුපියල් මිලියන 54.5 දක්වා ඉහළ ගොස් ඇත.

පඩිපාලක සභා ආඥා පනත අනුව සහ අනෙකුත් ව්‍යවස්ථාපිත වක්‍රෙල්ඛ ආදිය අනුව 2006 සිට මේ දක්වා සේවක වැටුප් උපරිම වශයෙන් 362% ක් පමණ ඉහළ ගොස් ඇත.

## නිගමනය

අක්‍රිය සහ පුද්ගලීකකරණය කිරීමට නම් කර තිබූ කහටගහ ආයතනය "මහින්ද චින්තන" ඉදිරි දැක්ම යටතේ පුද්ගලිකකරණය කිරීමේ ක්‍රියාදාමය නොසලකා හරිමින් ලාභදායී ව්‍යාපාරයක් වශයෙන් පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.

ඇත්ත වශයෙන්ම 2006 දී මෙහෙයුම් කටයුතු නැවත ආරම්භ කිරීමෙන් පසු කහටගහ මිනිරන් පතල් කර්මාන්තයේ සැහෙන දියුණුවක් ඇති වී තිබේ. ඉතා සුළු කාලයක් තුලදී ස්වාභාවික මිනිරන් අපනයනයට අමතරව සමාගම විසින් අගය වැඩි කරන ලද අවසන් නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට අරමුණු කරගෙන ඇත්තේ "මහින්ද චින්තන ප්‍රතිපත්තිය (පිටු අංක 48) යටතේ වන "ජාතික ආර්ථික සංවර්ධනයට මිනිරන් කර්මාන්තය දියුණු කිරීම මඟින්" දායක වෙමිනි.

මෙම වසරේ සමාගමේ ලාභය සහ ශුභදායී තත්වය කෙරෙහි සමාගමේ අධ්‍යක්ෂවරු විසින් මා වෙත ලබා දෙන ලද විශාල ධෛර්ය හා කිසිදු වෙහෙසක් නොබලා ලබා දෙන ලද දායකත්වය මහත් සේ බලපා ඇත.

සමාගමේ සියලුම සේවකයින්ගේ නොමඳ සහයෝගය හා කැපවීම නොවන්නට ආයතනයේ සාර්ථකත්වය හා ලාභදායීත්වය ලබා ගත නොහැකි වන බව සඳහන් කළ යුතු කාරණයක් වේ. විශේෂයෙන්ම වසර පුරාම මිහිතුල සේවකයින්ගේ අසීමිත උත්සාහය පිළිබඳව මෙහිදි ඉතා සතුටින් සටහන් තබමි.

ගරු කර්මාන්ත හා වාණිජ කටයුතු පිළිබඳ අමාත්‍යතුමාටද, ගරු කර්මාන්ත හා වාණිජ කටයුතු පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාටද, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයෙහි ගරු ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටද, මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටද, විශේෂයෙන් කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයටද, ආයතනයේ සියළුම සේවකයන්ටද මා මේ අවස්ථාවේ අතිශයින් ස්තූතිවන්ත වෙමි. අවසාන වශයෙන් අප සමාගම වෙනුවෙන් මෙම වසරේදී ද කිසිම පැකිලීමකින් තොරව සමාගමේ විගණකවරු වශයෙන් තම විගණක කටයුතු නොපිරිහෙලා ඉටු කල ආර්. නාගසිංහ සහ සමාගමටද මාගේ ස්තූතිය පිරිනමමි.

ඩී. කලන්සූරිය
සභාපති
**කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්**
**2014 සැප්තැම්බර් මස 03 වැනිදා**

# විගණන කමිටු වාර්තාව

## විගණන කමිටු කාර්ය භාර්ය

විගණන කමිටුවේ මූලික කාර්ය භාර්ය වන්නේ, අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිවැරදි මූල්‍ය වාර්තා හා විගණන ක්‍රියාවලියන් සහ මනා අභ්‍යන්තර පාලනයක් සහ අවදානම් කළමණාකරණ ක්‍රියාවලිය සහතික කිරීමයි.

මෙම කමිටුවේ මූලික වගකීම වන්නේ පහත සඳහන් කරුණු අධීක්ෂණය හා විමර්ෂණය කිරීමයි.

- මූල්‍ය ප්‍රකාශන වල ඇති විශ්වාසනීය හා නිවැරදි බව
- අභ්‍යන්තර පාලනයේ ඇති ප්‍රමාණාත්මක බව හා කාර්යක්ෂමතාව
- අභ්‍යන්තර හා බාහිර විගණන කටයුතු වල ක්‍රියාකාරකම් හා ඵලදායීතාව
- ව්‍යවස්ථාපිත හා නීතිමය අවශ්‍යතාවයන්ට අනුකූල වීම

## විගණන කමිටු සංයුතිය

විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරු තුන් දෙනෙකුගෙන් සමන්විත වන අතර සමාගමේ එකම කොටස්කරු වන මහා භාණ්ඩාගාරය විසින් නම් කරනු ලබන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු එහි සභාපතිත්වය දරනු ලබයි. සමාගමේ ලේකම්වරු කැඳවුම්කරු ලෙස කටයුතු කරනු ලැබේ. විගණන කමිටුවේ සංයුතිය පහත සඳහන් පරිදි වේ.

| | | |
|---|---|---|
| ඒ. ආර්. වික්‍රමසිංහ මහත්මිය | - | සභාපති |
| ඒ. යූ. එම්. යසීර් මහතා | - | අධ්‍යක්ෂ |
| ටී. එම්. ඒ. බන්සජයා මහතා | - | අධ්‍යක්ෂ |

## රැස්වීම් සහ පැමිණීම

වසර 2013 දී විගණන කමිටුව වාර 04 ක් රැස්වීම් පවත්වා ඇති අතර එම රැස්වීම් වලදී සාකච්ඡා කරන ලද කරුණු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වෙත යොමු කර ඇත. සමාගමේ කළමණාකාර මට්ටමේ නිලධාරීන්, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයෙන් පත් කරන ලද අභ්‍යන්තර විගණක සහ සමාගමේ ගණකාධිකාරීවරයා මෙම රැස්වීම් වලදී අවශ්‍ය වුවහොත් කැඳවනු ලබයි.

## ක්‍රියාකාරකම්

කෙටුම්පත් ගිණුම්, බාහිර විගණන වාර්තා, බාහිරින් පත් කරන ලද අභ්‍යන්තර විගණක විසින් ඉදිරිපත් කරනු ලබන අභ්‍යන්තර විගණක වාර්තා, ප්‍රගති වාර්තා, විකුණුම් වාර්තා, මූල්‍ය පාලනය, වංචා සහ වැරදීම් පිළිබඳ අවධානම සහ පාලන පද්ධතියේ ආරක්ෂාව ආදීය සමාලෝචනය හා සාකච්ඡා කිරීම තුලින් විගණන කමිටුවේ කාර්යයන් ඉටු කරනු ලැබේ. මෙම වාර්තා විගණන කමිටුව විසින් විමර්ශනය කල යුතු අතර නිර්දේශිත අතිරේක පාලන සහ අවදානම් අවම කිරීමේ උපක්‍රම ක්‍රියාත්මක කිරීම මගින් පවතින අභ්‍යන්තර පාලනය ශක්තිමත් කල යුතු අතර වැරදි සහ වංචාවන්ගෙන් සිදුවන බලපෑම සහ සමාගම විසින් මුහුණ දෙන මූල්‍ය හා මෙහෙයුම් අවධානම් අවම කල යුතුය.

## අභ්‍යන්තර පාලන පද්ධතිය

අභ්‍යන්තර විගණක විසින් කරන ලද විගණන කටයුතු වල ප්‍රතිඵල, කෝප් වාර්තා, අවසාන ගිණුම්, බාහිර විගණක නිකුත් කල කළමණාකාර ලිපිය සහ අයවැය වාර්තා ආදිය 2013 විගණන කමිටුව විසින් නිරීක්ෂණය කර ඇත. එහිදී උද්ගත වී ඇති කරුණු පිළිබඳව ආරම්භ කල යුතු ක්‍රියාදාමයන් සහ නිර්දේශයන් පිළිබඳව කළමණාකාරීත්වයේ ප්‍රතිචාරයන්හි ප්‍රමාණාත්මක බව ගැන අභ්‍යන්තර විගණක සැලකිල්ල යොමුකර ඇත.

## අනුකූලතාවය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්, 2007 අංක 07 දරණ සමාගම් ආඥා පනත, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ උපදේශන හා මග පෙන්වීම්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, සේවක අර්ථ සාධක අරමුදල, සේවක භාරකාර අරමුදල හා ජාතික ප්‍රසම්පාදන අමාත්‍යාංශයේ මගපෙන්වීම් උපදේශණ සහ වරින්වර නිකුත් කරනු ලබන රජයේ චක්‍රලේඛ ආදියට අනුව විගණන කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට, ව්‍යවස්ථාපිත නියමයන් පරිදි කලට වේලාවට විශ්වාසනීය මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ කිරීම සඳහා සහයෝගය ලබා දී ඇත.

කමිටුව වෙනුවෙන්

විගණන කමිටු සභාපති

## දැක්ම

"ඉහළ කාබන් ප්‍රතිශතයකින් යුත්, ස්වාභාවික ස්ඵටික ඉල්ලම් මිනිරන් ලොවට සපයන අනන්‍ය සැපයුම්කරු වීම."

## මෙහෙවර

"ස්වාභාවික මිනිරන් ඛණිජ සම්පත උපරිම ප්‍රයෝජනයට ගෙන, රටට විදේශ විනිමය උපයමින් හා සමාජ ආර්ථික සංවර්ධනය සඳහා ක්‍රියාකාරී කොටස්කරුවෙකු වීම."

## අරමුණු

"මිනිරන් කැණීම, ශුද්ධ කිරීම, නිර්යාත කිරීම, මිනිරන් කර්මාන්තය ආශ්‍රීත නිෂ්පාදන ඇතුළු මිනිරන් කර්මාන්තය වැඩි දියුණු කිරීම හා එහි උපරිම අගය වැඩි කිරීම."

## සංවිධාන ව්‍යුහය

විධායක සභාපතිවරයකු සහ අධ්‍යක්ෂ මණ්ඩලයක් යටතේ කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් සමාගම සංවිධානය වී තිබේ.

සමාගමේ මෙහෙයුම් ක්‍රියාකාරකම් පහත දැක්වෙන ක්ෂේත්‍ර යටතේ සංවිධානය කර තිබේ.

- ✓ කැණීම
- ✓ සැකසුම්
- ✓ යාන්ත්‍රික සහ විදුලි ඉංජිනේරු ශිල්පය
- ✓ අලෙවිකරණය
- ✓ පිරිස් අංශය
- ✓ පරිපාලනය
- ✓ මුල්‍ය කටයුතු සහ ගිණුම්කරණය
- ✓ සැපයීම් සහ ගබඩා අංශය
- ✓ සාමාන්‍ය සිවිල් ඉංජිනේරු අංශය
- ✓ ආරක්ෂක අංශය

## කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

**2014** මාර්තු **31** න් අවසන් වර්ෂය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික වාර්තාව

2014 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මේ සමඟ ඉදිරිපත් කරනු ලැබේ. එහි අඩංගු මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව පිළියෙල කොට ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

## ප්‍රධාන කාර්යයන්

සමාගමේ ප්‍රධාන කාර්යයන් වලට පහත සඳහන් දෑ ඇතුලත් වේ.

1. 1957 අංක 49 දරණ රාජ්‍ය කර්මාන්ත සංස්ථා පනත යටතේ පල කරන ලද ගැසට් නිවේදනය මඟින් පිහිටුවන ලද රාජ්‍ය පතල් කැණීම් සහ ඛණිජ සංවර්ධන සංස්ථාවේ කොලොන්ගහ - කහටගහ පතල් ප්‍රදේශයේ නම් කර ඇති ව්‍යාපාරය පවත්වාගෙන යාම.

2. එකී රාජ්‍ය පතල් කැණීම් සහ ඛණිජ සංවර්ධන සංස්ථාවේ කොලොන්ගහ - කහටගහ වශයෙන් නම් කර ඇති එම පාර්ශවයට අයත් කරගත් සහ පාර්ශවය විසින් පරිහරණය කරන ලද චංචල සහ නිශ්චල දේපල වල හිමිකම ලබා ගැනීම.

## මූල්‍යමය ප්‍රතිඵල

මූල්‍යමය ප්‍රතිඵල මූල්‍ය ප්‍රකාශන වල 04 වැනි පිටුවේ සඳහන් කොට ඇත.

## දේපල, පිරියත සහ උපකරණ

එක් එක් වර්ෂය තුල දේපල, පිරියත සහ උපකරණ වල සංචලනයන් මූල්‍ය ප්‍රකාශන වල 18 වන සටහනෙහි දක්වා තිබේ.

## ආයෝජන

සමාගම රු.5,675,000.00 ක මුදලක් සේවකයින්ගේ පාරිතෝෂික මුදල් ගෙවීම සඳහා ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර ඇත.

## පරිත්‍යාග

ගිණුම්කරණ කාල පරිච්ඡේදය තුල, සමාගම විසින් කිසිදු පරිත්‍යාගයක් සිදු කර නැත.

## විගණකවරයාගේ වාර්තාව

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකවරයාගේ වාර්තාව, වාර්ෂික වාර්තාවට ඇතුලත් කොට තිබේ.

## අධ්‍යක්ෂවරුන්ගේ විශ්‍රාමය

සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියට අනුව නැවත පත්වීමේ පදනම මත ටී. එම්. ඒ. බංසජයා මහතා විශ්‍රාම ගත විය යුතු වන අතර තනතුරෙහි අඛණ්ඩව සිටිනා අනිකුත් අධ්‍යක්ෂවරුන්ගේ ඒකමතික සහයෝගය මත ඔහු නැවත තෝරා පත් කිරීමට සුදුසුකම් ලබයි.

සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියට අනුව නැවත පත්වීමේ පදනම මත ඒ. යූ. එම්. යසීර් මහතා විශ්‍රාම ගත විය යුතු වන අතර තනතුරෙහි අඛණ්ඩව සිටිනා අනිකුත් අධ්‍යක්ෂවරුන්ගේ ඒකමතික සහයෝගය මත ඔහු නැවත තෝරා පත් කිරීමට සුදුසුකම් ලබයි.

සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියට අනුව නැවත පත්වීමේ පදනම මත එම්. එස්. එල්. අලී ඛාන් මහතා විශ්‍රාම ගත විය යුතු වන අතර තනතුරෙහි අඛණ්ඩව සිටිනා අනිකුත් අධ්‍යක්ෂවරුන්ගේ ඒකමතික සහයෝගය මත ඔහු නැවත තෝරා පත් කිරීමට සුදුසුකම් ලබයි.

## 2014 මාර්තු 31 දිනට අධ්‍යක්ෂවරු

සමාලෝචිත වර්ෂය තුලදී අධ්‍යක්ෂ තනතුර හොබවන ලද අයවලුන්ගේ නම් පහත දැක්වෙන පරිදි වේ.

ඩී. කලන්සූරිය මහතා
ඒ. යූ. එම්. යසීර් මහතා
ඒ. ආර්. වික්‍රමසිංහ මහත්මිය

ටී. එම්. ඒ. බංසජයා මහතා
අයි. එම්. ජුනයිස් මහතා
ඩබ්. එම්. සී. පී. වී. වාසල මහතා

එම්. එස්. එල්. අලී ඛාන් මහතා 2014 මාර්තු මස 14 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලද අතර, ඔහු නැවත පත් වීම සඳහා සුදුසුකම් ලබා ඇත.

## අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුල අධ්‍යක්ෂ මණ්ඩලයේ මුළු පාරිශ්‍රමිකය වන (රු.1,293,998.00) මූල්‍ය ප්‍රකාශනවල 10 වැනි සටහනෙහි දක්වා තිබේ.

## සමාගමේ කොන්ත්‍රාත්තු සහ යෝජිත කොන්ත්‍රාත්තු සමඟ අධ්‍යක්ෂවරුන්ගේ සම්බන්ධය

සමාගමේ කොන්ත්‍රාත්තු සහ යෝජිත කොන්ත්‍රාත්තු සමඟ අධ්‍යක්ෂවරුන්ගේ සම්බන්ධතාව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරනු ලැබේ.

## ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂවරුන්ගේ දැනුම හා විශ්වාසය අනුව, රජයට සහ සේවකයන්ට අදාල සියලු ව්‍යවස්ථාපිත ගෙවීම්, අද දින වන විට නිරවුල් කොට තිබිම හෝ සමාගමේ පොත් වලට ගෙන තිබීම පිළිබඳව අධ්‍යක්ෂවරු තෘප්තිමත්ය.

## ශේෂ පත්‍ර දිනෙන් පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනෙන් පසුව වැදගත් සිදුවීම් සලකා බැලූ අතර අවශ්‍ය විටදී, යෝග්‍ය ගැලපීම් සහ හෙළිදරව් කිරීම් කර ඇත.

## විගණකවරු

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුල, වරලත් ගණකාධිකාරීන් වන, රණවීර නාගසිංහ සහ සමාගම විගණකවරුන් වශයෙන් සේවය කොට ඇත. විගණකවරුන් වශයෙන් හැර වෙනත් සම්බන්ධතා නොතිබූ බව විගණකවරු සනාථ කර ඇත. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ ආචාරධර්ම සංග්‍රහයට අනුව ඔවුන් ස්වාධීන බව සනාථ කර ඇත.

මූල්‍ය වර්ෂය සඳහා, විගණකවරුන් සඳහා ගෙවිය යුතු ගාස්තු, මූල්‍ය ප්‍රකාශන වල 11 වැනි සටහනේ දක්වා ඇත.

විගණකවරුන් වශයෙන් තව දුරටත් කටයුතු කිරීම පිළිබඳ කැමැත්ත රණවීර නාගසිංහ සහ සමාගම විසින් ප්‍රකාශ කර ඇත. ඔවුන්ව නැවත පත් කිරීමට සහ ඔවුන්ගේ පාරිශ්‍රමිකයන් තීරණය කිරීමට අධ්‍යක්ෂවරුන්ට බලය පැවරීමට යෝජනාවක් වාර්ෂික මහා සභා රැස්වීමේදී යෝජනා කරනු ඇත.


**කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි අත්සන් තබන ලදී.**

| ………………………………….. | ……………………………………… | ……………………………… |
|---|---|---|
| **අධ්‍යක්ෂ** | **අධ්‍යක්ෂ** | **ලේකම්වරු**<br>**එකවුන්ටිං සිස්ටම්ස් සෙක්රිටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්** |

# විශේෂ ගිණුම්කරණ තොරතුරු

## නිෂ්පාදනය

| වර්ෂය | මෙට්‍රික් ටොන් |
|---|---|
| 2008/9 | 877 |
| 2009/10 | 915 |
| 2010/11 | 771 |
| 2011/12 | 888.33 |
| 2012/13 | 1018 |
| 2013/14 | 848 |





## විකුණුම්

| වර්ෂය | මෙට්‍රික් ටොන් |
|---|---|
| 2008/9 | 497 |
| 2009/10 | 295.2 |
| 2010/11 | 760.3 |
| 2011/12 | 850.3 |
| 2012/13 | 537.8 |
| 2013/14 | 793 |





## ආදායම

| වර්ෂය | රුපියල් මිලියන |
|---|---|
| 2008/9 | 60.4 |
| 2009/10 | 21.1 |
| 2010/11 | 105.1 |
| 2011/12 | 128.2 |
| 2012/13 | 91.6 |
| 2013/14 | 144.11 |





## දළ ලාභය

| වර්ෂය | රුපියල් මිලියන |
|---|---|
| 2008/9 | 44.8 |
| 2009/10 | 13.1 |
| 2010/11 | 62.4 |
| 2011/12 | 74.9 |
| 2012/13 | 53.5 |
| 2013/14 | 91.36 |





## බදු අය කිරීමට පෙර ශුද්ධ ලාභය

| වර්ෂය | රුපියල් මිලියන |
|---|---|
| 2008/9 | 37.3 |
| 2009/10 | 1.5 |
| 2010/11 | 37.7 |
| 2011/12 | 54.3 |
| 2012/13 | 16.4 |
| 2013/14 | 21.18 |




## ශුද්ධ වත්කම් අගය

| වර්ෂය | රුපියල් මිලියන |
|---|---|
| 2008/9 | 4.4 |
| 2009/10 | 137.1 |
| 2010/11 | 166.2 |
| 2011/12 | 214.5 |
| 2012/13 | 423.4 |
| 2013/14 | 366.33 |



# කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

## 2013/14
## වාර්ෂික ගිණුම්

## 2013 අප්‍රේල් 01 සිට 2014 මාර්තු 31 දක්වා

**රණවීර, නාගසිංහ සහ සමාගම**
**වරලත් ගණකාධිකාරීවරුන්**

# කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්
2013/14


| අන්තර්ගතය | පිටුව |
| --- | --- |
| ආයතනික තොරතුරු | 01 |
| විගණකවරුන්ගේ වාර්තාව | 02 |
| විස්තීරණ ආදායම් ප්‍රකාශය | 03-04 |
| මූල්‍ය තත්ව ප්‍රකාශනය | 05 |
| ස්කන්ධ වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය | 06 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 07 |
| වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති | 08- 15 |
| ගිණුම් සඳහා සටහන් | 16 - 26 |
| ආදායම් බදු ගණනය කිරීම | 27-28 |

# කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

## 1 ආයතනික තොරතුරු

### *සංස්ථාපනය පිළිබඳ විස්තර*

සීමිත වගකීම් සහිත රාජ්‍ය සමාගමක් වන අතර 1987 අංක 17 දරණ සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාපිත කරන ලදී. 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරන ලදී.

### *රේඛීය අමාත්‍යාංශය*

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

### *ප්‍රධාන කාර්යය*

ස්වාභාවික ඉල්ලම් මිනිරන් කැණීම,සකස් කිරීම සහ අපනයනය කිරීම

### *ලියාපදිංචි කාර්යාලය*

අංක 100 1/3, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත, කොළඹ 02.

### *අධ්‍යක්ෂ මණ්ඩලය*

ඩී. කලන්සූරිය මහතා (සභාපති)
ඒ. ආර්. වික්‍රමසිංහ මහත්මිය
අයි. එම්. ජුනයිස් මහතා
ටී. එම්. ඒ. බංසජයා මහතා
ඒ. යූ. එම්. යසීර් මහතා
එස්. නිජමුඩීන් මහතා (2013/07/01 දින ඉල්ලා අස්වී ඇත)
ඩබ්. එම්. සී. පී. වාසල මහතා (2013/02/27 පත්ව ඇත)
එම්. එස්. එල්. අලී ඛාන් මහතා (2014/03/14 පත්ව ඇත)

### *සමාගම් ලේකම්*

එකවුන්ට්ං සිස්ටම්ස් සෙක්රිටේරියල් සර්විසස් ( ප්‍රයිවට්) ලිමිටඩ්
අංක 02, කාසල් වීදිය, කොළඹ 04.
දුරකථන : 0112505152 ෆැක්ස් : 5364295

### *සමාගමේ විගණකවරු*

රණවීර, නාගසිංහ සහ සමාගම
වරලත් ගණකාධිකාරීවරු
අංක 277, නව හුණුපිටිය පාර, දළුගම, කැළණිය.

එස්. රණවීර, A. C. A
එන්. නාගසිංහ, B.Sc., F. C. A.
වයි. රණවීර, B.Sc., A. C. A.

නව හුණුපිටිය පාර,
දළුගම,
කැළණිය.
දු.ක. / ෆැක්ස් : 0112910571, 2905196

පැරණි වෙළඳපොළ පාර,
කොටුවේගොඩ,
මාතර.
දු.ක.: 0412222365

## ස්වාධීන විගණකගේ වාර්තාව

### කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් සමාගමේ සමාජිකයින් වෙත

#### *මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ වාර්තාව*

මේ සමඟ ඇති කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් සමාගම 2014 මාර්තු 31 දිනට වූ මූල්‍ය තත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධ වෙනස් වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය හා වෙනත් පැහැදිලි කිරීමේ සටහන් වලින් යුක්ත මූල්‍ය ප්‍රකාශන අප විසින් විගණනය කරන ලදී.

#### *මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමණාකාරීත්වයේ වගකීම*

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව, මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම කළමණාකාරීත්වයේ වගකීම වනු ලැබේ. මෙම වගකීමට, වංචා හෝ වැරදි නිසා වන සාවද්‍ය ප්‍රකාශන වලින් තොර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණව ඉදිරිපත් කිරීමට අදාල අභ්‍යන්තර පාලන සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යෑම සහ යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා හා සාධාරණ ගිණුම් ඇස්තමේන්තු සකස් කිරීම ඇතුලත් වේ.

#### *විගණන විෂය පථය සහ මතය සඳහා පදනම*

අපගේ විගණනය පදනම් කරගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම අපගේ වගකීම වනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් අනුව අපගේ විගණනය සිදු කල අතර, ඒ අනුව එකී මූල්‍ය ප්‍රකාශන සාවද්‍ය තොරතුරු වලින් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා ගැනීම සඳහා අපගේ විගණනය සැලසුම් කිරීම හා සිදුකිරීම අවශ්‍ය වේ. එකී මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති මුදල් සහ හෙලිදරව් කිරීම් වලට උපකාරීවන සාක්ෂි පරීක්ෂණ පදනමක් මත විමර්ශනය කිරීම, යොදාගෙන ඇති ගිණුම්කරණ මූලධර්ම තක්සේරු කිරීම, අධ්‍යක්ෂවරුන් විසින් සකස් කර ඇති වැදගත් ඇස්තමේන්තු, මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම ඇගයීම සහ එකී මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කොට ඉදිරිපත් කර තිබේද යන වග විගණනයට ඇතුලත් වේ.

අපගේ උපරිම දැනුමේ හා විශ්වාසයේ හැටියට මෙම විගණනය සඳහා අවශ්‍ය යැයි හැඟුණු සියලුම තොරතුරු හා පැහැදිලි කිරීම් ලබා ගත්තෙමු. එම නිසා අප විසින් කර ඇති විගණනයේ අප දරණ විගණන මතය සඳහා සාධාරණ පදනමක් සලසනු ඇතැයි යනු අපගේ විශ්වාසයයි.

#### *මතය*

අපගේ මතය අනුව මූල්‍ය තත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධ වෙනස් වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ගිණුම්කරණ සටහන් සහ අනුගමනය කල ගිණුම්කරණ මූලධර්ම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව පිළියෙල කර ඇති බවත්, 2007 අංක 07 දරණ සමාගම් පනතේ නියමයන් අනුව සැපයිය යුතු තොරතුරු සපයා ඇති බවත් 2014 මාර්තු 31 දිනට සමාගමේ මූල්‍ය තත්වය පිළිබඳවත් එදිනෙන් අවසන් වූ වර්ෂය තුල එහි මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳවත් සත්‍ය හා සාධාරණ දර්ශනයක් පෙන්නුම් කරයි.

#### *සමාගම සමඟ කොන්ත්‍රාත්වලට අධ්‍යක්ෂවරුන්ගේ සම්බන්ධය*

අපට ලබා දුන් තොරතුරු අනුව, සමාගමේ වත්මන් අධ්‍යක්ෂවරුන්, ගිණුම සඳහා වන 07 වැනි සටහන මඟින් හෙලිදරව් කර ඇති පරිදි, 2014 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය තුලදී සමාගම සමඟ කිසිදු කොන්ත්‍රාත්තුවකට ඍජුව හෝ වක්‍රව සම්බන්ධ වී නොමැත.

#### *වෙනත් නිත්‍යානුකූල අවශ්‍යතාවයන් වාර්තා කිරීම*

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ වගන්ති 151(2) අවශ්‍යතාවයන් අනුව පිළියෙල කර ඇත.

වරලත් ගණකාධිකාරීවරු
කොළඹ.
2014 අගෝස්තු 19.

රණවීර, නාගසිංහ සහ සමාගම
*(වරලත් ගණකාධිකාරීවරුන්)*

**කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්**

02

## විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

**මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා**

| *වටිනාකම රුපියල් වලින්* | සටහන් | **2014** | **2013** |
|---|---|---|---|
| **ආදායම** | | | |
| මිනිරන් විකුණුම් | 08 | 144,111,798.15 | 91,685,689.71 |
| සෘජු පිරිවැය, කැණීම් පිරිවැය | 09 | (52,750,707.80) | (36,423,588.62) |
| **දළ ලාභය / (අලාභය)** | | **91,361,090.35** | **55,262,101.09** |
| **අඩු කලා : මෙහෙයුම් පිරිවැය** | | | |
| කාර්ය මණ්ඩල පිරිවැය | 10 | (15,394,843.66) | (12,067,725.74) |
| ආයතනික සහ පරිපාලන පිරිවැය | 11 | (19,537,971.83) | (13,298,040.74) |
| නඩත්තු පිරිවැය | 12 | (1,339,248.06) | (1,130,017.81) |
| උපයෝගී පිරිවැය | 13 | (599,029.49) | (685,730.62) |
| ක්ෂය පිරිවැය | 14 | (20,167,747.60) | (6,148,360.68) |
| විකුණුම් හා බෙදාහැරීම පිරිවැය | 15 | (3,877,278.11) | (3,574,954.66) |
| පාරිතෝෂික දීමනා | | (2,229,903.20) | (928,316.76) |
| **මුළු මෙහෙයුම් පිරිවැය** | | **(63,146,021.95)** | **(37,833,147.01)** |
| **මෙහෙයුම් ලාභය / (අලාභය)** | | 28,215,068.40 | 17,428,954.08 |
| මුල්‍ය හා වෙනත් වියදම් | 16 | (8,473,835.17) | (2,869,703.49) |
| විවිධ ආදායම් | 17 | 1,446,547.45 | 1,929,793.13 |
| **බදු පෙර ලාභය / (අලාභය)** | | 21,187,780.68 | 16,489,043.72 |
| බදුකරණය | | (4,581,762.69) | (852,851.15) |
| **වර්ෂය සඳහා ලාභය / (අලාභය)** | | **16,606,017.99** | **15,636,192.57** |

රණවීර, නාගසිංහ සහ සමාගම
*(වරලත් ගණකාධිකාරීවරුන්)*

# කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

## විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

| **මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා** | | **2014** | **2013** |
|---|---|---|---|
| *වටිනාකම රුපියල් වලින්* | **සටහන්** | | |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | |
| විදේශ විනිමය ලාභ / (පාඩු) | | (1,942,245.39) | (3,109,074.14) |
| දේපල පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය | | - | 197,329,460.70 |
| **වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම්** | | **(1,942,245.39)** | **194,220,386.56** |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | | **14,663,772.60** | **209,856,579.13** |

රණවීර, නාගසිංහ සමාගම.
වරලත් ගණකාධිකාරීවරුන්
එස්. රණවීර, A. C. A
එන්. නාගසිංහ, B.Sc., F. C. A.
වයි. රණවීර, B.Sc., A. C. A.

කොළඹ කාර්යාලය:
අංක : 277,
නව හුණුපිටිය පාර,
දළුගම,
කැළණිය.
දූ.ක. / ෆැක්ස් : 0112910571, 2905196

ප්‍රධාන කාර්යාලය:
අංක : 41/5 බී,
පැරණි වෙළඳපොළ පාර,
කොටුවේගොඩ,
මාතර.
දූ.ක.: 0412222365


## කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්
## මූල්‍ය තත්ව ප්‍රකාශනය

| මාර්තු 31 ට<br>*වටිනාකම රුපියල් වලින්* | සටහන් | 2014 | 2013 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත සහ උපකරණ | 18 | 267,234,317.20 | 256,076,582.10 |
| ස්ථාවර තැන්පතු - එක්සත් ජනපද වාසික | | - | 27,723,833.78 |
| පාරිතෝෂික අරමුදල් ආයෝජන ගිණුම | | 5,675,000.00 | 5,000,000.00 |
| | | **272,909,317.20** | **288,800,415.88** |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 19 | 105,267,315.56 | 135,514,956.19 |
| ණය ගැතියෝ, තැන්පතු සහ ලැබිය යුතු දෑ | 20 | 9,889,269.61 | 28,056,138.55 |
| මුදල් සහ මුදල් සමාන දේවල් | 21 | 13,800,259.29 | 11,709,454.63 |
| | | **128,956,844.46** | **175,280,549.37** |
| **මුළු වත්කම්** | | **401,866,161.66** | **464,080,965.25** |
| **ස්කන්ධ සහ බැරකම්** | | | |
| **ප්‍රාග්ධන සහ සංචිත** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 22 | 13,000,000.00 | 13,000,000.00 |
| රඳවා ගත් ඉපැයීම් | | 103,442,157.99 | 160,276,371.37 |
| සංචිත | 23 | 250,220,462.70 | 250,220,462.70 |
| | | **366,662,620.69** | **423,496,834.07** |
| **දිගු කාලීන බැරකම්** | | | |
| වාරික ණය | 24 | - | 2,500,000.00 |
| කල්බදු ණයහිමියෝ | 25 | 3,662,917.77 | 6,016,747.41 |
| පාරිතෝෂික ප්‍රතිපාදන | | 6,003,227.56 | 4,688,320.36 |
| | | **9,666,145.33** | **13,205,067.77** |
| **ජංගම බැරකම්** | | | |
| කල්බදු ණය හිමියෝ | 25 | 2,353,829.64 | 3,298,799.34 |
| වෙළෙඳ සහ වෙනත් ණය හිමියෝ | 26 | 919,065.85 | 1,337,448.25 |
| ගෙවිය යුතු ලාභාංශ | 27 | 954,196.07 | 3,702,986.65 |
| බදුකරණය සඳහා ප්‍රතිපාදන | 28 | 14,609,921.88 | 12,376,561.15 |
| උපචිත ගාස්තු | 29 | 6,700,382.20 | 6,663,268.02 |
| | | **25,537,395.64** | **27,379,063.41** |
| **මුළු ස්කන්ධ සහ බැරකම්** | | **401,866,161.66** | **464,080,965.25** |

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 7 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවන්ට අනුකූලවන පරිදි පිළියෙල කර ඇති බව මම සහතික කරමි.

..............................

ප්‍රධාන මූල්‍ය නිලධාරී

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වන අතර අනුමත කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදී.

................................... ..............................

අධ්‍යක්ෂ අධ්‍යක්ෂ

## කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

**ස්කන්ධ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය**

මාර්තු 31 ට

| *වටිනාකම් රුපියල් වලින්* | කොටස් ප්‍රාග්ධනය | ප්‍රත්‍යාගණන සංචිත | සමුච්චිත ලාභය / (අලාභය) | එකතුව |
|---|---|---|---|---|
| **2012 අප්‍රේල් 01 ට ශේෂය** | 13,000,000.00 | 39,784,286.00 | 147,749,389.44 | 200,533,675.44 |
| **වර්ෂය සඳහා ලාභය / (අලාභය)** | - | - | 15,636,192.57 | 15,636,192.57 |
| | | | | - |
| **පෙර වර්ෂය සඳහා වන ගැලපුම්** | | | (136.50) | (136.50) |
| | | | | - |
| **වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම්** | | 197,329,460.70 | (3,109,074.14) | 194,220,386.56 |
| **2013 මාර්තු 31 ට ශේෂය** | **13,000,000.00** | **237,113,746.70** | **160,276,371.37** | **410,390,118.07** |
| **2013 අප්‍රේල් 01 ට ශේෂය** | 13,000,000.00 | 237,113,746.70 | 160,276,371.37 | 410,390,118.07 |
| **පෙර වර්ෂය සඳහා වන ගැලපුම්** | | | (70,437,768.12) | (70,437,768.12) |
| **වර්ෂය සඳහා ලාභය / (අලාභය)** | - | - | 16,606,017.99 | 16,606,017.99 |
| **ලාභාංශ ප්‍රකාශ කිරීම 2013** | - | - | (1,060,217.86) | (1,060,217.86) |
| **වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම්** | | - | (1,942,245.39) | (1,942,245.39) |
| **2014 මාර්තු 31 ට ශේෂය** | **13,000,000.00** | **237,113,746.70** | **103,442,157.99** | **353,555,904.69** |

**පෙර වර්ෂය සඳහා ගැලපුම්**

| | |
|---|---|
| තොග ගැලපුම් මත පැන නැගුණු | (66,396,403.67) |
| ආදායම් බදු අඩුවෙන් ප්‍රතිපාදනය කිරීම මත | (4,041,364.45) |
| | (70,437,768.12) |

**කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| **මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා**<br>*වටිනාකම් රුපියල් වලින්* | **2014** | **2013** |
|---|---|---|
| **මෙහෙයුම් කටයුතු වලින් / (කටයුතු වල භාවිතා කිරීමෙන්) ලද මුදල් ප්‍රවාහ** | | |
| ආදායම් බදු වියදම් වලට පෙර ශුද්ධ ලාභය/(අලාභය) | **21,187,781** | 16,489,044 |
| ගැලපීම්: | | |
| පාරිතෝෂික ප්‍රතිපාදන | **2,229,903** | 928,317 |
| කල් බදු පොලිය | **-** | 853,495 |
| පූර්ව වර්ෂය සඳහා ගැලපීම් | **(66,396,404)** | - |
| ස්පෘශ්‍ය ස්ථාවර වත්කම් මත ක්ෂය වීම | **20,167,748** | 7,785,785 |
| විදේශ විනිමය අලාභ | **(1,942,245)** | (3,109,074) |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය | **(24,753,218)** | 22,947,566 |
| තොග (වැඩිවීම්) / අඩු වීම් | **30,247,641** | (28,535,571) |
| ලැබිය යුතු දේවල් වල (වැඩිවීම)/ අඩුවීම් | **18,166,869** | (2,061,377) |
| ණය හිමියන්ගේ (අඩුවීම්) /වැඩිවීම් | **(418,382)** | 836,487 |
| (අඩුවීම්) / වැඩිවීම් උපචිත වියදම් | **37,114** | 1,446,001 |
| **මෙහෙයුම් කටයුතු වලින් /(කටයුතු වල යෙදීමෙන් )ලද ශුද්ධ මුදල් ප්‍රවාහ** | **48,033,241** | **(28,314,460)** |
| **ආයෝජන කටයුතු වලින් /(කටයුතු වල භාවිතා කිරීමෙන්) ලද මුදල් ප්‍රවාහ** | | |
| ස්පෘශ්‍ය ස්ථාවර වත්කම් මිලදී ගැනීම | **(31,325,483)** | (14,084,009) |
| ස්ථාවර තැන්පතු | **27,723,834** | 30,035,142 |
| පාරිතෝෂික අරමුදල් ආයෝජනය | **(675,000)** | (5,000,000) |
| **ආයෝජන කටයුතු වලින් / (කටයුතු වල භාවිතා කිරීමෙන්) ලද ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(4,276,649)** | **10,951,133** |
| **මූල්‍ය කටයුතු වලින් / (කටයුතු වල භාවිතා කිරීමෙන්) ලද මුදල් ප්‍රවාහ** | | |
| බැංකු ණය ගෙවීම් | **(2,500,000)** | (6,000,000) |
| ආදායම් බදු ගෙවීම | **(6,495,788)** | - |
| ලාභාංශ බදු ගෙවීම | **(3,702,987)** | - |
| පාරිතෝෂික ගෙවීම් | **(914,996)** | (92,432) |
| කල්බදු ගෙවීම් | **(3,298,799)** | (3,970,176) |
| **මූල්‍ය කටයුතු වලින් / (කටයුතු වල යෙදීමෙන්) ලද ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(16,912,570)** | **(10,062,608)** |
| **මුදල් හා මුදල් සමාන දේවල් වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම)** | **2,090,805** | (4,478,368) |
| වර්ෂය මුලදී මුදල් සහ මුදල් සමාන දේවල් | **11,709,455** | 16,187,823 |
| **වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් සමාන දේවල්** | **13,800,259** | **11,709,455** |
| **මුදල් සහ මුදල් සමාන දේවල්** | | |
| ලංකා බැංකුව - රිදීගම | **188,365** | 1,318,828 |
| ලංකා බැංකුව - කොල්ලුපිටිය | **36,788** | 958,589 |
| වාසික විදේශ ව්‍යවහාර ඩොලර් ගිණුම - ලංකා බැංකුව, කොල්ලුපිටිය | **13,541,287** | 9,416,114 |
| සුළු මුදල් - ප්‍රධාන කාර්යාලය | 23,399 | 3,792 |
| සුළු මුදල් - පතල් කාර්යාලය | 10,420 | 12,132 |
| | **13,800,259** | **11,709,455** |

# කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

## 2014 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

### 1. සාමාන්‍ය තොරතුරු

කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් යනු, 1996 අංක 29 දරණ රාජ්‍ය ව්‍යවසායන් පුනරුත්ථාපනය කිරීමේ පනත යටතේ වර්ෂ 1997 දී රජයට නැවත පවරනු ලැබුවා වූ ද , මීට ඉහත දී 'ජනතාකරණය' කරනු ලැබ තිබුණා වූද සමාගමකි. දැනට එය සම්පූර්ණයෙන්ම රජය සතු ව්‍යාපාරික ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක වෙමින් පවතියි.

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුලදී, සමාගමේ ප්‍රධාන කාර්යය වූයේ, මිනිරන් කැණීම සහ ඒවා විදේශීය සහ දේශීය වෙළෙඳ පොලෙහි විකිණීමය.

2013 අප්‍රේල් 01 සිට 2014 මාර්තු 31 දක්වා වූ වර්ෂය සඳහා, කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් හි මූල්‍ය ප්‍රකාශන, අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මතයකට අනුකූලව, 2014 අගෝස්තු මස 19 වන දින නිකුතුව සඳහා බලය පැවරිය යුතුව තිබේ.

### 2 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කල මූලික ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පහත දක්වා ඇත. විශේෂයෙන් දක්වා ඇති දැ හැර මෙම ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අඛණ්ඩව අනුගමනය කර ඇත.

#### 2.1 පිළියෙල කිරීමේ පදනම

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මඟින් ප්‍රකාශිත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින්ට (SLFRS හා LKAS) අනුව පිළියෙල කර ඇත.

2014 මාර්තු 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය හා ඊට පෙර ගිණුම් කාල පරිච්ඡේද සඳහා ගිණුම් පිළියෙල කිරීමේදී ආයතනයේ මීට පෙර පැවති (එස්. එල්. ඒ. එස් ) අනුගමනය කර ඇත.

ආයතනයේ 2014 මාර්තු 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා පළමු වරට එස් එල් එෆ් ආර් එස් අනුගමනය කරමින් 2011 අප්‍රේල් 01 වන දින හෝ ඉන් ඉදිරියට බල පැවැත්වෙන පරිදි ගිණුම් පිළියෙල කර ඇත.

ආයතනය විසින් එස් එල් එෆ් ආර් එස් වලට අනුව ප්‍රථම ගිණුම් පිළියෙල කිරීමේදී 2011 .04.01 වන දිනෙන් ඉදිරියට සියළුම ගිණුම් වර්ෂ සඳහා අඛණ්ඩව එස් එල් එෆ් ආර් එස් අනුගමනය කරමින් 2011.04.01 වන දිනට එම ගිණුම්කරණ ප්‍රමිතින් පැවතුනා සේ වන පරිදි ගිණුම් පිළියෙල කර ඇත.

ශ්‍රී ලංකා මුදල් වලින් දී ඇති මූල්‍ය ප්‍රකාශන අතීත පිරිවැය පදනම මත පිළියෙල කර ඇත. ආදායම හා වියදම ගැලපීමේදී උපචිත පදනම අනුගමනය කර ඇත.

ප්‍රවර්ථන වර්ෂයේ ගිණුම් ප්‍රකාශන සමග අනුකූල වීම සඳහා පෙර වර්ෂවල ගිණුම් තොරතුරු යලි සකස් කර ඉදිරිපත් කර ඇත.

## 2.2 අනුකූලතා ප්‍රකාශය

ආයතනය විසින් 2014 මාර්තු 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා මූල්‍ය තත්ව ප්‍රකාශනය , විස්තීරණ ආදායම් ප්‍රකාශනය , ස්කන්ධ වෙනස් වීමේ ප්‍රකාශනය , මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා ගිණුම්කරණ සටහන් සහ අනුගමනය කරන ගණකාධිකරණ ප්‍රතිපත්තීන් තීරණය කිරීමේදී ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ පොදුවේ පිළිගත් ගණකාධිකරණ මූලධර්ම වලට අනුව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මඟින් ප්‍රකාශිත ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව පිළියෙල කර ඇත. උද්ධමනය සඳහා ගැලපුම් කර නැත.

## 2.3 මූල්‍ය වර්ෂය

පොදු මූල්‍ය වර්ෂයක් සමාගම සතු වන අතර එය අවසන් වන්නේ මාර්තු 31 න්ය.

## 2.4 අඛණ්ඩ පැවැත්ම

සමාගම සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්තිය වන්නේ, පක්කරනු ලැබූ අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ ක්‍රියාත්මකව තිබෙන ආයතනයක් ලෙස පවත්වාගෙන යාම සහ එය පවරා ගත් දින සිට ඈවර කිරීමට හෝ එහි මෙහෙයුම් කටයුතු නතර කිරීමට අපේක්ෂා නොකිරීමය.

## 2.5 බදුකරණය

*ප්‍රවර්තන බදු*

ආදායම් බදු සඳහා ප්‍රතිපාදන, මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කොට ඇති පරිදි ආදායම් සහ වියදම් මූලධර්ම මත පදනම්ව ඇති, 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ සහ එහි ඉන් ඉක්බිති සංශෝධනයන්හි විධිවිධාන වලට අනුකූලව ගණනය කර ඇත.

භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය සඳහා වූ පුරස්කාර ගෙවීම් මත රඳවුම් බද්ද අඩු නොකෙරේ.

*විලම්භීත බදු*

මූල්‍ය ප්‍රකාශන වාර්තා කරන දිනය හා ශේෂ පත්‍ර දිනය අතර වත්කම් හා වගකීම් හා එහි ගෙන යන අගය මත බදු පදනම් වල වෙනස් වීම් මත වන තාවකාලික වෙනස්වීම් සඳහා මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා විලම්භීත බදු ගණනය කර නැත.

ප්‍රවර්තන වර්ෂයේ ආදායම් බදු ගණනය කිරීමේදී 2013 අප්‍රේල් මස 01 දිනට වූ මිනිරන් තොගයේ අගය අඩු වීම සැලකිල්ලට ගෙන නැත.

## 2.6 තොග ( ගිණුම් වල 19 වැනි සටහන )

**මිනිරන්**

ආදායම් ප්‍රකාශය සඳහා වූ 09 වැනි සටහන යටතේ දක්වා ඇති, දරන ලද මුළු කැණීම් පිරිවැය මත පදනම්ව තොග තක්සේරු කිරීම සිදු කරනු ලැබේ. තක්සේරු කිරීමේ වාර්තා වලට ප්‍රමාණය, අනුපාතිකය සහ තක්සේරු කිරීම ඇතුලත් වේ.

රණවීර, නාගසිංහ සහ සමාගම
*(වරලත් ගණකාධිකාරීවරුන්)*

අප වෙත ලැබී තිබෙන තොරතුරු අනුව, තොග තක්සේරු කිරීම පහත සඳහන් පරිදි වේ. :-

| | ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | වටිනාකම (ශ්‍රී ලංකා රුපියල්) |
|---|---|---|
| 2013 අප්‍රේල් 01 ට තොග | 1,843.68 | 121,764,354.37 |
| තොග වල අගය අඩු වීම | (1,005.33) | (66,396,403.67) |
| ගිණුම් සඳහා ශේෂය | 838.35 | 55,367,950.70 |
| වසර තුල කැණීම් | 848.14 | 80,473,100.42 |
| වසර තුල අපනයන | (793.50) | (52,406,065.69) |
| 2014 මාර්තු 31 ට තොග | 892.99 | 83,435,985.43 |
| ටොන් 1 ට සාමාන්‍ය පිරිවැය | (83,435,985.43/892.99) | 93,433.28 |

**පරිභෝජනය කරන ද්‍රව්‍ය**

කැණීම් ක්‍රියාවලියේදී සහ වෙනත් නඩත්තු කටයුතු වලදී, මිනිරන් හැර පරිභෝජනය කරනු ලබන වෙනත් අයිතමයන් මෙයට ඇතුලත් වේ. ලැබී ඇති තොරතුරු අනුව, මුළු අයිතම සංඛ්‍යාව 1,500 ඉක්මවන අතර තොග පාලන ක්‍රමය සහ වාර්තාකරණය පූර්ණ වශයෙන් පරිගණකගත කර ඇත.

තොග පිරිවැය පහත සඳහන් පිරිවැය සූත්‍ර පදනම් කරගෙන ගිණුම්ගත කර ඇත

මිනිරන් - සත්‍ය වශයෙන්ම දැරූ කැණීම් පිරිවැය පදනම්ව

පරිභෝජන ද්‍රව්‍ය සත්‍ය පිරිවැය - හරිත මධ්‍යක මිල ක්‍රමය පදනම්ව

## 2.7 දේපල , පිරියත සහ උපකරණ (ගිණුම් වල 18 වැනි සටහන)

### 2.7.1 පිරිවැය / තක්සේරුව

***දේපල , පිරියත සහ උපකරණ***

දේපල, පිරියත සහ උපකරණ ආරම්භයේදී පිරිවැයෙන් සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරන අලාභයන් පැවතුණි නම් එය අඩු කර හඳුනාගෙන ඇත. තවද හඳුනා ගැනීමේ සාධක පවතී නම් දේපල, පිරියත හා උපකරණ ප්‍රතිෂ්ඨාපන වියදම් කොටස් පිරිවැයට ඇතුලත් කරනු ලැබේ. දේපල, පිරියත හා උපකරණ වල වැදගත් කොටස් කාලයත් සමඟ ප්‍රතිෂ්ඨාපනය කල යුතු වූ විට ආයතනය එවැනි කොටස් වෙනම වත්කම් වශයෙන් හඳුනාගෙන එහි අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ හා ජීවිත කාලයට අනුව ක්ෂය කරනු ලැබේ. එසේම ප්‍රධාන පරීක්ෂණ පවත්වා ඇති විට හා හඳුනා ගැනීමේ සාධක ගැන සෑහීමකට පත් වන විට පිරියත හා උපකරණ පිරිවැය ප්‍රතිෂ්ඨාපන පිරිවැය සේ සලකා එහි ගෙන යන අගයට හඳුනාගනු ලැබේ. විස්තීර්ණ ආදායම් ප්‍රකාශන තුල අනෙකුත් සියලුම අළුත්වැඩියා හා නඩත්තු පිරිවැය වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

*රණවීර, නාගසිංහ සහ සමාගම*
*(වරලත් ගණකාධිකාරීවරුන්)*

අයිතමයක් ඉවත් කිරීම නිසා හෝ එහි භාවිතාවෙන් ඉවත් කිරීමෙන් තවදුරටත් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ බලාපොරොත්තු නොහැකි වූ විට තවදුරටත් දේපල පිරියත හා උපකරණ වශයෙන් හඳුනා නොගනී. වත්කම් ඉවත් කිරීමේ ලාභයක් හෝ පාඩුවක් පවතීනම් (වත්කමේ ගෙන යන අගයේ හා ශුද්ධ උපලබ්ධි අගයේ වෙනස) ඉවත් කර වර්ෂයේ ආදායම් ප්‍රකාශයට ඇතුලත් කරනු ලැබේ.

වත්කම් වල ඉවත් කිරීමේ වටිනාකම, භාවිතා කල කාලය සහ ක්ෂය කිරීමේ ක්‍රමය සෑම මුදල් වර්ෂයක් අවසානයේදී සමලෝචනය කර අවශ්‍ය ගැලපුම් කරනු ලැබේ.

වාර්තා කරන දිනට පැවති සම්පූර්ණ නොකල ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් දැරූ ප්‍රාග්ධන වියදම් නොනිමි වැඩ වශයෙන් පිරිවැයට හඳුනාගනු ලැබේ. අදාල වත්කම සම්පූර්ණයෙන්ම නිම කල පසු දේපල පිරියත හා උපකරණ ගිණුමට මාරු කරනු ලැබේ. නොනිමි ප්‍රාග්ධන වැඩ එහි අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ ලබා දීමට සුදුසු මට්ටමට පත් වූ විට ක්ෂය වීම් ගණනය කිරීම ආරම්භ කරනු ලැබේ.

*දේපල පිරියත හා උපකරණ වල සාධාරණ අගය*

ආයතනයේ එහි දේපල පිරිවැය සාධාරණ අගය මත හා සාධාරණ අගයෙහි වන වෙනස්කම් ආදායම් ප්‍රකාශන වල හඳුනා ගනිමින් පවත්වාගෙන යනු ලැබේ. ඊට අමතරව දේපල පිරියත ප්‍රත්‍යාගණන අගය හා සාධාරණ අගය අතර වෙනස හඳුනාගෙන එය අනෙකුත් විස්තීර්ණ ආදායම් තුල ඇතුලත් කරනු ලැබේ. ආයතනය 2014 මාර්තු 31 වන දිනට පැවති එවැනි වත්කම් වල සාධාරණ අගය තක්සේරු කිරීම සඳහා ප්‍රවීණ තක්සේරු කරුවන් ලවා ස්වාධින තක්සේරුවක් කර ඇත. දේපල පිරියත හා උපකරණ වෙළඳ පොල පදනම් කරගත් සාක්ෂි, එහි ස්වභාවය වැනි විශේෂ වෙළඳපොල සාධක යොදා ගෙන සංසන්දනාත්මකව මිල ගණන් ගලපමින් දේපල වල පිහිටිම හා තත්වයද සැලකිල්ලට ගෙන අගය කරන ලදී.

*මූල්‍ය නොවන වත්කම් හානිකරණය*

ආයතනයේ වාර්තා කරන දිනට පැවති වත්කම් වල හානිකරණයන් පෙන්නුම් කරන්නේද යන්න තක්සේරු කර ඇත. එවැනි තත්වයක් පවතී නම් හෝ යම් වත්කමක් සඳහා වාර්ෂික හානිකරණ පරීක්ෂණයක් අවශ්‍ය වූ ආයතනය එහි උපලබ්ධි කර ගත හැකි වටිනාකම තක්සේරු කරනු ලැබේ. එහි සාධාරණ අගයෙන් විකිණීමේ වියදම් අඩු කල පසු අගයට හා එහි ප්‍රයෝජනවත් වටිනාකම යන දෙකෙන් වැඩි අගය එහි උපලබ්ධි අගය වේ. වත්කමක් වෙනත් වත්කමකින් හෝ වත්කම් කාණ්ඩයකින් ඉතා ඉහළ ස්වාධිනත්වයකින් මුදල් ප්‍රවාහයන් ජනනය කරන්නේ නම් එය ස්වාධින වත්කමක් ලෙස තිරණය වේ. වත්කමක ගෙන යන අගය අය කර ගත හැකි වටිනාකමට වඩා වැඩි වූ විට එකී වත්කම හානිකරණය වී ඇතැයි සලකන අතර එහි අය කර ගත හැකි අගය දක්වා ලියා හරිනු ලැබේ.

සමාලෝචිත වර්ෂය තුල ආයතනයෙහි වත්කම් වල ගෙන යන අගය, අය කර ගත හැකි අගය නොඉක්මවන බව සහතික කර ගැනීම සඳහා යොදා ගැනෙන ක්‍රියාපිලිවෙත සඳහන් කරන්නා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 36 අනුගමනය කිරීමට පියවර ගෙන ඇත.

රණවීර, නාගසිංහ සහ සමාගම
*(වරලත් ගණකාධිකාරීවරුන්)*

### 2.7.2 ක්ෂය වීම් / ක්‍රමක්ෂය

සියලුම පිරියත හා උපකරණ පිරිවැය/ ප්‍රත්‍යාගණන අගය මත ඇස්තමේන්තු කර ආර්ථික ජීවිත කාලය පුරා සමාන වාරික වලින් අය වන පරිදි සරල මාර්ග ක්ෂය වීම් පදනම අනුගමනය කරමින් ක්ෂය ප්‍රතිපාදන ගණනය කර ඇත.

සමාගම වර්ෂ ආරම්භයේ එහි සියළු වත්කම් ප්‍රත්‍යාගණනය කල අතර වත්කම් වල ඉතිරිව ඇති ආර්ථික ජීවිත කාලයද සැලකිල්ලට ගෙන පහත සඳහන් නව ක්ෂය කිරීමේ අනුපාතය හඳුන්වා දී ඇත.

| | |
|---|---|
| ගොඩනැගිලි | 03% |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 10% |
| විදුලි උපකරණ | 20% |
| මෝටර් වාහන | 10% |
| වෙනත් වත්කම් | 10% |
| කාර්යාල උපකරණ | 20% |
| විදුලි ජනකය | 08% |
| මිහිතුල සංවර්ධන වැඩ කටයුතු | 10% |
| ලී බඩු සහ සවිකිරීම් | 20% |
| ප්‍රධාන කාර්යාලය - කොටස් කර සවි කිරීම් | 20% |

## 2.8 කල්බදු වත්කම්

මුල්‍ය කල්බදු යනු සියළුම සැලකිය යුතු අවධානම් සහ ලාභ එකී බදු වත්කම් වල හිමිකරුට හිමි වන අවස්ථාවකි. මෙම වත්කම් බද්ද ආරම්භයේදීම බදු වත්කම් වල සාධාරණ අගයට හෝ අවම බදු ගෙවීම් වටිනාකමේ ශුද්ධ වර්තමාන අගය යන දෙකෙන් අඩු අගයට ප්‍රාග්ධනිත කරයි. බදු වාරික වල ප්‍රාග්ධන අගය අඩු වීම සහ බදු පොලිය ඉතිරි බදු වගකීම් වලට ස්ථාවර පොලී අගයක් ලෙස වන පරිදි වෙන් කර හඳුනාගනී. කල් බදු මත පොලිය ආදායම් ප්‍රකාශනය තුල මුල්‍ය වියදමක් ලෙස හඳුනා ගනී.

බදු වත්කම එහි අපේක්ෂිත ආර්ථික ජීවිත කාලය පුරා ක්ෂය කරනු ලැබේ. නමුත් බදු කාලය අවසානයේදී කල්බදු වත්කමේ අයිතිය ලැබෙන බවට සාධාරණ තහවුරුවක් නොලැබෙන විට වත්කම අපේක්ෂිත ආර්ථික ජීවිත කාලය හෝ බදු කාලය යන දෙකෙන් අඩු කාලය තුල ක්ෂය කරනු ලැබේ.

මෙහෙයුම් කල්බදු මත වන බදු ගෙවීම් ආදායම් ප්‍රකාශය තුල මෙහෙයුම් වියදමක් ලෙස සරල මාර්ග ක්‍රමයට බදුකාලය පුරා හඳුනාගනී.



## 2.9 මූල්‍ය වත්කම්

### 2.9.1 ණය සහ ලැබිය යුතු දෑ

ණය හා ලැබිය යුතු දෑ ආදායම් ඉපැයීමේ පරමාර්ථයෙන් පවත්වාගෙන යන වත්කම් නොවන අතර විවෘත වෙළඳපොලේ මිල ගණන් ප්‍රකාශිත වත්කම් ද නොවන අතර ස්ථිර හෝ තීරණය කල ගෙවීම් වලින් යුක්ත වන අතර වාර්තා කරන මූල්‍ය වර්ෂයට පසුව මාස 12 ක් තුල උපලබ්ධි නොවන දෑ හැර අනෙකුත් වත්කම් ජංගම වත්කම් වශයෙන් හඳුනා ගනී. කල්පිරීමට මාස 12 කට වඩා ගත වන ණය හා ලැබිය යුතු දෑ ජංගම නොවන වත්කම් වශයෙන් හඳුනා ගනී. වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු මුදල් හා මුදල් සමාන තත්වයේ දෑ ආයතනයේ ණය සහ ලැබිය යුතු දෑ ලෙස මූල්‍ය තත්ව ප්‍රකාශනයේ හඳුනා ගනී.

### 2.9.2 මූල්‍ය වගකීම්

වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ, බැංකු ණය හා අනෙකුත් ණය සමාගමේ මූල්‍ය වගකීම් වලට ඇතුලත් වේ. ආරම්භයේදී සියලුම මූල්‍ය වගකීම් සාධාරණ අගයට හඳුනාගන්නා අතර පසුව බල පවත්නා පොලී ක්‍රමය පදනම් කරගෙන හිලව් පිරිවැයට හඳුනා ගනී. කෙසේ නමුත් වට්ටම් කිරීමේදී සිදුවන මූල්‍ය බලපෑම ප්‍රමාණාත්මක නොවන විට පිරිවැයට වාර්තා කරයි.

## 2.10 ණයගැතියෝ, තැන්පතු සහ ලැබිය යුතු දෑ (ගිණුම් වල 20 වැනි සටහන)

වෙළඳ ණයගැතියෝ යනු සාමාන්‍ය ව්‍යාපාරික කාර්යේදී ගණුදෙනුකරුවන්ට සිදු කල සාමාන්‍ය වෙළඳමය විකුණුම් වලට ලැබිය යුතු දෑ වේ. බලාපොරොත්තු වන ණය එකතු කිරීමේ කාලය හෝ සාමාන්‍යයෙන් ණය චක්‍රය වර්ෂයක් හෝ ඊට අඩු වන විට වෙළඳ ණය ජංගම වත්කමක් වශයෙන් වෙන් කර හඳුනා ගනී. එසේ නොවන විට ජංගම නොවන වත්කමක් වශයෙන් වාර්තා කරයි.

ආරම්භයේදී වෙළඳ ණය ගැතියන් සාධාරණ අගයට හඳුනා ගන්නා අතර පසුව හානි කරන ප්‍රතිපාදන ගැලපූ බලපවත්නා පොලී ක්‍රමය භාවිතා කර හිලව් පිරිවැයට හඳුනා ගනී.

## 2.11 විදේශ විනිමය පරිවර්තනය

ආයතනයේ ක්‍රියාත්මක වන හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වශයෙන් ශ්‍රී ලංකා රුපියල භාවිතා කරමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.

විදේශ විනිමය පරිවර්තනය කිරීමේදී ගණුදෙනුව ප්‍රථම වතාවට හඳුනාගැනීම සඳහා සුදුසුකම් ලැබූ දිනට පැවති විනිමය අනුපාතය පදනම් කරගෙන ආයතනය විසින් ගණුදෙනුව ආරම්භයේදී භාවිතා කරන මෙහෙයුම් මුදල් ඒකකයට පරිවර්තනය කර ගිණුම් තබනු ලැබේ.

විදේශ මුදල් ඒකක වලින් හඳුනාගත් මූල්‍ය වත්කම් හා වගකීම් මූල්‍ය ප්‍රකාශන වාර්තා කරන දිනයට පැවති විනිමය අනුපාතය පදනම් කරගෙන භාවිතා කරන මුදල් ඒකකයට පරිවර්තනය කරනු ලැබේ. මූල්‍ය අයිතම පරිවර්තනය කිරීමේදී හෝ ගණුදෙනු කිරීමේදී පැන නගින වෙනස්කම් ආදායම් හෝ වියදම් වශයෙන් හඳුනාගනී.

විදේශ ව්‍යවහාරික මුදලින් අතීත පිරිවැයට හඳුනාගත් මූල්‍ය නොවන අයිතමයන් ගණුදෙණුව ආරම්භ දිනට පැවති විදේශ විනිමය අනුපාතය භාවිතා කරමින් පරිවර්තනය කරනු ලැබේ.
මූල්‍ය නොවන අයිතමයන් එහි සාධාරණ අගයට, සාධාරණ අගය තීරණය කරන දිනට පැවති විනිමය අනුපාතය භාවිතා කරමින් හඳුනා ගනී.

රණවීර, නාගසිංහ සහ සමාගම
*(වරලත් ගණකාධිකාරීවරුන්)*

මූල්‍ය නොවන වත්කම් වශයෙන් හඳුනාගත් දෑ සාධාරණ අගයට පරිවර්තනය කිරීමේදී පැන නගින ලාභ පාඩු එහි සාධාරණ අගය වෙනස් වීමේ ලාභ පාඩු වලට සමගාමීව හඳුනා ගනු ලැබේ. (උදා: සාධාරණ අගයට පරිවර්තනය කිරීමේදී පැන නගින ලාභ පාඩු වෙනත් විස්තීර්ණ ආදායම් වශයෙන්) කෙසේ නමුත් මූල්‍ය නොවන අයිතමයන් සඳහා කිසිම විදේශ විනිමය පරිවර්තනය කිරීමේ ලාභයක් හෝ පාඩුවක් වර්ෂය තුල හඳුනා නොගනී.

## 2.12 කාර්ය මණ්ඩල ප්‍රතිලාභ

### (A) නිශ්චිත ප්‍රතිලාභ

පාරිතෝෂික තක්සේරු කිරීම සඳහා නියම කර ඇති ක්‍රමවේදය වූ ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් 19 (එල් කේ ඒ එස් 19) ට අනුකූලව, සමාලෝචනයට භාජනය වන වර්ෂය තුලදී ගිණුම් වල ප්‍රතිපාදන සපයා තිබේ.

### (B) නිශ්චිත දායකත්ව සැලසුම්

සේවකයින් සේවා නියුක්තිකයන්ගේ අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා පවත්නා නිතිරීති වලට යටත්ව හිමිකම ඇත. ආයතනය විසින් සේවකයන්ගේ මූලික වැටුප මත පිළිවෙලින් 12% ක් හා 3% ක් සේවක අර්ථ සාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා දායක වේ.

### (C) කෙටි කාලීන සේවක ප්‍රතිලාභ

ආයතන සේවකයින් විසින් ඔවුන් සැපයූ සේවාවන් සඳහා එම වර්ෂයේ වේතන, වැටුප්, ගෙවූ වාර්ෂික නිවාඩු සහ අසනීප නිවාඩු, ප්‍රසාද දීමනා සහ අනෙකුත් මූල්‍ය නොවන ප්‍රතිලාභ සඳහා හිමිකම ඇත.

# 3 පිරිවැටුම, ආදායම සහ වියදම්

## 3.1 ආදායම හඳුනා ගැනීම

ආදායම එය ලැබුණු දින නොසලකා එහි ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුලට ගලා ඒ යැයි හැගෙන විට හා ආදායම විශ්වාසනීය මට්ටමකින් හඳුනාගත හැකි විට ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගනී. එල් කේ ඒ එස් 18 අනුව, ගිවිසුම් ගතව හඳුනාගත් (බදු හා වරාය ගාස්තු ඇතුලත් නොවන) ලැබුණු හෝ ලැබිය යුතු ගෙවීම් වාරික සාධාරණ අගයට ආදායම් ප්‍රකාශනයට ඇතුලත් කරනු ලැබේ.

ආයතනය මූල්‍ය වර්ෂය තුල ආදායම් හඳුනාගැනීමේදී එෆ් ඕ බී අගය පදනම්ව වර්ෂය තුල වාර්තා කල විකුණුම් වටිනාකම භාවිතා කර ඇත.

## 3.2 වියදම්

වර්ෂය සඳහා ලාභ/ (අලාභ) ගණනය කිරීමේදී, ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී සහ ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීමේදී දැරීමට සිදු වන සියළු වියදම්, උපචිත පදනම මත ආදායමෙන් අයකරගෙන ඇත.

*රණවීර, නාගසිංහ සහ සමාගම*
*(වරලත් ගණකාධිකාරීවරුන්)*

# 4. කොටස් / ප්‍රකාශිත ප්‍රාග්ධනය (ගිණුම්වල 22 වැනි සටහන)



රු. 13,000,000/- ක කොටස් නිකුත් කොට ඇත.

සමාගමේ ලේකම් වෙත තිබෙන කොටස් ලෙජරයේ ඉහත සඳහන් මුදල්, මහා භාණ්ඩාගාරයේ ලේකම් වෙත ඇති කොටස් ලෙස සටහන් වී තිබේ. 2002 වසරේ සිට පමණක් සමාගමේ කොටස් තබා ගැනීම් වලට අදාල තොරතුරු, වත්මන් ලේකම්වරුන් සතුව පවතී.

## 5. ප්‍රාග්ධන බැඳියාවන්

ශේෂ පත්‍රයේ දිනයන් වන විට, ප්‍රාග්ධන බැඳියාවන් නොමැත.

## 6. අසම්භාව්‍ය බැරකම්

කහටගහ ප්‍රදේශයේ කැණීම් ඉඩමක කොටසක් සම්බන්ධයෙන් උසාවියේ නඩුවක් පවතින බව වාර්තා වේ.

## 7. අධ්‍යක්ෂවරුන්ගේ සම්බන්ධතාවය

ලැබී තිබෙන තොරතුරු අනුව, සමාගමේ කිසිදු අධ්‍යක්ෂවරයකු ඍජුව හෝ වක්‍රව සමාගමේ කවර හෝ කොන්ත්‍රාත්තුවකට දැනට සම්බන්ධ වී නොමැත.

# කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

**ගිණුම් සඳහා සටහන්**

| **මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා** | | **2014** | **2013** |
|---|---|---|---|
| *වටිනාකම් රුපියල් වලින්* | සටහන් | | |
| **08** **ආදායම සහ ප්‍රදාන** | | | |
| විකුණුම් ආදායම | | 144,111,798.15 | 91,685,689.71 |
| **09** **මිනිරන් කැණීම් පිරිවැය** | | | |
| ආරම්භක තොග ශේෂය | **09-01** | 55,367,950.33 | 91,963,177.22 |
| කාර්යය මණ්ඩල පිරිවැය | **09-02** | 46,429,875.16 | 37,293,153.32 |
| උපකාරක සේවා පිරිවැය | **09-03** | 27,347,420.98 | 24,585,550.00 |
| පුරස්කාරක ගෙවීම් | | 7,041,446.76 | 4,346,062.45 |
| | | 136,186,693.23 | 158,187,942.99 |
| අඩු කලා : අවසන් තොග | | (83,435,985.43) | (121,764,354.37) |
| **කාලපරිච්ඡේදය තුල කැණීම් පිරිවැය** | | 52,750,707.80 | 36,423,588.62 |

**වර්ෂ ආරම්භක තොගය**

ආයතනයේ සත්‍ය වශයෙන්ම 2013 අප්‍රේල් 01 දිනට පැවති මිනිරන් තොගය හඳුනා ගැනීම සඳහා භෞතික තොග සත්‍යාපනයක් හා ආගනනයක් කර ඇත. මෙහිදී රු. 66,396,403/67 තරම් වටිනා මිනිරන් තොගයක් විකිණිය නොහැකි තත්වයේ පවතින බව අනාවරණය විය. එම නිසා කළමනාකරණය විසින් විකිණිය හැකි නිෂ්පාදනයේ නිවැරදි නිරූපණය කිරීම සඳහා වර්ෂ ආරම්භයේදීම එම තොගය ලියා හැරීමට තිරණය කරන ලදී.

| | | | |
|---|---|---|---|
| **ආරම්භක තොග ශේෂය** | **09-01** | | |
| ආරම්භක තොග ශේෂය | | 121,764,354.00 | - |
| තොග ලියා හැරීම් | | (66,396,403.67) | - |
| ගිණුම් සඳහා ශේෂය | | **55,367,950.33** | **-** |
| **වේතන පිරිවැය** | **09-02** | | |
| වැටුප් සහ වේතන | | 32,545,283.42 | 25,219,965.94 |
| අතිකාල | | 2,774,981.56 | 4,129,251.37 |
| දීමනා | | 1,998,416.40 | 1,823,055.85 |
| අර්ථ සාධක අරමුදලේ දායක මුදල් | | 3,905,434.01 | 3,026,395.91 |
| භාර අරමුදලේ දායක මුදල් | | 976,358.48 | 756,598.98 |
| සේවක ශුභ සාධනය | | 3,419,160.91 | 1,959,769.89 |
| ප්‍රසාද දීමනා | | 810,240.38 | 378,115.38 |
| | | **46,429,875.16** | **37,293,153.32** |
| **උපකාරක සේවා පිරිවැය** | **09-03** | | |
| කැණීම් වියදම් | | 13,248,802.75 | 12,627,678.33 |
| බල ශක්තිය සහ විදුලිය | | 14,098,618.23 | 11,957,871.67 |
| | | **27,347,420.98** | **24,585,550.00** |

## කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

**ගිණුම් සඳහා සටහන්**

| **මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා** | | **2014** | **2013** |
|---|---|---|---|
| *වටිනාකම් රුපියල් වලින්* | **සටහන්** | | |
| **10** | **කාර්ය මණ්ඩල පිරිවැය** | | |
| | අධ්‍යක්ෂවරුන් සඳහා දීමනා | 1,293,998.00 | 1,695,710.07 |
| | පරිපාලන වැටුප් සහ වේතන | 10,189,796.04 | 8,316,155.78 |
| | අතිකාල | 1,718,575.97 | 699,936.52 |
| | දීමනා | 550,254.25 | - |
| | අර්ථ සාධක අරමුදලේ දායක මුදල් | 1,222,775.51 | 997,938.69 |
| | භාර අරමුදලේ දායක මුදල් | 305,693.89 | 249,484.67 |
| | ප්‍රසාද දීමනා | 113,750.00 | 108,500.00 |
| | | 15,394,843.66 | 12,067,725.74 |
| **11** | **ආයතනික සහ පරිපාලන පිරිවැය** | | |
| | කුලිය | 1,911,800.00 | 2,287,000.00 |
| | වරිපනම් සහ බදු | 9,397.16 | 15,409.31 |
| | පොදු වියදම් | 6,292.07 | 44,416.61 |
| | වෛද්‍ය ආධාර | 42,508.48 | 37,473.67 |
| | රක්ෂණ | 586,654.25 | 541,840.10 |
| | මුද්‍රණ වියදම් සහ ලිපිද්‍රව්‍ය | 509,252.28 | 522,159.13 |
| | තැපැල් ගාස්තු | 76,856.10 | 82,848.53 |
| | නීති හා වෘත්තිය ගාස්තු | 246,197.65 | 389,892.00 |
| | ආරක්ෂක ගාස්තු | 5,342,133.88 | 4,321,749.39 |
| | පොත් සහ වාර සඟරා | 47,990.00 | 64,329.00 |
| | ලේකම් ගාස්තු | 200,773.00 | 223,993.00 |
| | විගණන ගාස්තු | 165,304.00 | 165,000.00 |
| | ගමන් වියදම් සහ ප්‍රවාහනය | 3,597,210.99 | 3,717,814.56 |
| | සංග්‍රහ | 472,753.57 | 335,678.99 |
| | විදුලිය | 325,606.35 | 237,891.94 |
| | බලපත්‍ර සහ අවසර පත්‍ර | 200,682.00 | 74,144.51 |
| | දායක ගෙවීම් | 46,598.76 | - |
| | පර්යේෂණ හා සංවර්ධන වියදම් | 1,559,691.07 | - |
| | ඉන්ධන | 1,513,888.64 | - |
| | වාර්ෂික ගිණුම් පිළියෙල කිරීමේ වියදම් | 329,293.00 | - |
| | වතු වියදම් | 1,759,488.58 | - |
| | පුහුණු කිරීමේ වියදම් | 587,600.00 | 235,300.00 |
| | විවිධ වියදම් | - | 1,100.00 |
| | | **19,537,971.83** | **13,298,040.74** |
| **12** | **නඩත්තු පිරිවැය** | | |
| | කාර්යාල සහ කාර්යාල උපකරණ නඩත්තුව | 563,541.95 | 107,100.20 |
| | ගොඩනැගිලි නඩත්තුව | 335,077.12 | 212,036.07 |
| | යන්ත්‍ර සූත්‍ර නඩත්තුව | 440,628.99 | 485,881.54 |
| | අභ්‍යන්තර මාර්ග | - | 325,000.00 |
| | | **1,339,248.06** | **1,130,017.81** |
| **13** | **උපයෝගී පිරිවැය** | | |
| | ජල ගාස්තු | 48,044.40 | 92,559.78 |
| | දුරකථන | 550,985.09 | 593,170.84 |
| | | **599,029.49** | **685,730.62** |

## කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

**ගිණුම් සඳහා සටහන්**

| මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා | | 2014 | 2013 |
|---|---|---|---|
| *වටිනාකම් රුපියල් වලින්* | සටහන් | | |
| **14** | **ක්ෂය පිරිවැය** | | |
| | ගොඩනැගිලි | 1,629,149.99 | 753,502.76 |
| | විදුලි උපකරණ | 345,096.00 | 1,053,232.89 |
| | විදුලි ජනකය | 1,234,127.23 | 162,887.76 |
| | මොටර් වාහන | 1,876,300.50 | 1,695,000.00 |
| | කාර්යාල උපකරණ | 598,352.04 | 75,903.00 |
| | වෙනත් වත්කම් | 693,999.00 | 278,181.06 |
| | පිරියත සහ යන්ත්‍ර සූත්‍ර | 12,343,888.93 | 1,321,386.32 |
| | මිහිතුල සංවර්ධන වියදම් | 788,354.51 | 530,855.83 |
| | ලී බඩු සහ සවිකිරීම් වියදම් | 329,754.03 | 113,585.70 |
| | ප්‍රධාන කාර්යාලය - කොටස් කර සවිකිරීම් වියදම් | 163,825.36 | 163,825.36 |
| | මෝටර් වාහන | 164,900.00 | - |
| | | **20,167,747.60** | **6,148,360.68** |
| **15** | **විකුණුම් හා බෙදාහැරීමේ පිරිවැය** | | |
| | වාප්පු අංශයට ප්‍රවාහනය | 1,376,000.00 | 864,000.00 |
| | අලෙවි ප්‍රවර්ධනය | 897,096.70 | 889,193.91 |
| | ප්‍රචාරණ වියදම් | 854,180.00 | 1,062,295.28 |
| | අපනයන වියදම් | 750,001.41 | 759,465.47 |
| | | **3,877,278.11** | **3,574,954.66** |
| **16** | **මූල්‍ය හා වෙනත් පිරිවැය** | | |
| | බැංකු ගාස්තු | 234,311.95 | 74,482.42 |
| | හිමිකම් නොපෑ කල්බදු වල වැට් | 331,560.00 | 331,560.00 |
| | කල්බදු පොලී ගාස්තු | 671,376.66 | 853,495.08 |
| | තොග, තොග ගැලපුම් | 13,752.06 | 1,500.00 |
| | අනුමත නොවූ VAT යෙදවුම් බද්ධ | 5,970,583.50 | - |
| | සී එස් ආර් - සමාජ සත්කාරක වියදම් | 1,252,251.00 | - |
| | ජාතිය ගොඩනැගීමේ බද්ද | - | 87,250.99 |
| | පොල් වගාව | - | 1,521,415.00 |
| | | **8,473,835.17** | **2,869,703.49** |
| **17** | **විවිධ ආදායම්** | | |
| | වතු ආදායම | 193,033.00 | 50,936.00 |
| | පොලී ආදායම | 1,253,514.45 | 1,878,857.13 |
| | | **1,446,547.45** | **1,929,793.13** |

**කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්**

**ගිණුම් සඳහා සටහන්**

18 **දේපල, පිරියත සහ උපකරණ**

| | ශේෂය 2013/3/31 | එකතු කිරීම්/ පැවරුම් | ඉවත් කිරීම් / පැවරුම් | ප්‍රත්‍යාගණන ගැලපුම් | ශේෂය 2014/03/31 |
|---|---|---|---|---|---|
| **ඉදිරියට ගෙන යන දළ වටිනාකම** | | | | | |
| සින්නක්කර ඉඩම | 25,500,000.00 | - | - | - | 25,500,000.00 |
| ගොඩනැගිලි | 54,304,999.82 | - | - | - | 54,304,999.82 |
| පිරියත සහ යන්ත්‍ර සූත්‍ර | 122,817,135.61 | 621,753.73 | - | - | 123,438,889.34 |
| විදුලි උපකරණ | 1,719,980.00 | 5,500.00 | - | - | 1,725,480.00 |
| මෝටර් වාහන | - | 1,649,000.00 | - | - | 1,649,000.00 |
| වෙනත් වත්කම් | 3,021,375.00 | 3,918,615.00 | - | - | 6,939,990.00 |
| කාර්යාලයීය උපකරණ | 2,656,363.97 | 335,396.25 | - | - | 2,991,760.22 |
| විදුලි ජනකය | 15,426,590.40 | - | - | - | 15,426,590.40 |
| මිහිතුල සංවර්ධනය | 7,705,000.00 | 178,545.08 | - | - | 7,883,545.08 |
| පොල් වගා සංවර්ධනය | 1,694,235.36 | - | - | - | 1,694,235.36 |
| ලී බඩු සහ සවි කිරීම් වියදම් | 1,648,770.14 | - | - | - | 1,648,770.14 |
| ප්‍රධාන කාර්යාලය - කොටස් කර සවි කිරීම් | 819,126.80 | - | - | - | 819,126.80 |
| | 237,313,577.10 | 6,708,810.06 | - | - | 244,022,387.16 |
| | **ශේෂය 2013/3/31** | **එකතු කිරීම්/ පැවරුම්** | **ඉවත් කිරීම් / පැවරුම්** | **ප්‍රත්‍යාගණන ගැලපුම්** | **ශේෂය 2014/03/31** |
| **මූල්‍ය කල් බදු මත වත්කම්** | | | | | |
| මෝටර් වාහන | 18,763,005.00 | - | - | - | 18,763,005.00 |
| | 18,763,005.00 | - | - | - | 18,763,005.00 |
| | **ශේෂය 2013/3/31** | **එකතු කිරීම්/ පැවරුම්** | **ඉවත් කිරීම් / පැවරුම්** | **ප්‍රත්‍යාගණන ගැලපුම්** | **ශේෂය 2014/03/31** |
| **නොනිම් වැඩ** | | | | | |
| **පිරියත සහ යන්ත්‍ර සූත්‍ර** | - | 4,834,049.52 | - | - | 4,834,049.52 |
| **ගොඩනැගිලි** | - | 19,782,623.12 | - | - | 19,782,623.12 |
| | - | 24,616,672.64 | - | - | 24,616,672.64 |
| **මුළු වත්කම්** | 256,076,582.10 | 31,325,482.70 | - | - | 287,402,064.80 |

# කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

## ගිණුම් සඳහා සටහන්

| | ශේෂය 2013/3/31 | එකතු කිරීම්/ පැවරුම් | ඉවත් කිරීම් / පැවරුම් | ප්‍රත්‍යාගණන ගැලපුම් | ශේෂය 2014/03/31 |
|---|---|---|---|---|---|
| **දේපල, පිරියත සහ උපකරණ** | | | | | |
| **ක්ෂය වීම්** | | | | | |
| **පිරිවැයට හෝ තක්සේරුවට** | | | | | |
| සින්නක්කර ඉඩම | - | - | - | - | - |
| ගොඩනැගිලි | - | 1,629,149.99 | - | - | 1,629,149.99 |
| පිරියත සහ යන්ත්‍ර සූත්‍ර | - | 12,343,888.94 | - | - | 12,343,888.94 |
| විදුලි උපකරණ | - | 345,096.00 | - | - | 345,096.00 |
| මෝටර් වාහන | - | 164,900.00 | - | - | 164,900.00 |
| වෙනත් වත්කම් | - | 693,999.00 | - | - | 693,999.00 |
| කාර්යාල උපකරණ | - | 598,352.04 | - | - | 598,352.04 |
| විදුලි ජනකය | - | 1,234,127.23 | - | - | 1,234,127.23 |
| මිහිතුල සංවර්ධනය | - | 788,354.51 | - | - | 788,354.51 |
| ලී බඩු සහ සවි කිරීම් වියදම් | - | 329,754.03 | - | - | 329,754.03 |
| ප්‍රධාන කාර්යාලය - කොටස් කර සවි කිරීම් | - | 163,825.36 | - | - | 163,825.36 |
| | - | 18,291,447.10 | - | - | 18,291,447.10 |

| **මූල්‍ය කල්බදු මත වත්කම්** | ශේෂය 2013/3/31 | එකතු කිරීම්/ පැවරුම් | ඉවත් කිරීම් / පැවරුම් | ප්‍රත්‍යාගණන ගැලපුම් | ශේෂය 2014/03/31 |
|---|---|---|---|---|---|
| මෝටර් වාහන | - | 1,876,300.50 | - | - | 1,876,300.50 |
| | - | 1,876,300.50 | - | - | 1,876,300.50 |
| **සම්පූර්ණ ක්ෂය** | - | 20,167,747.60 | - | - | 20,167,747.60 |
| **සම්පූර්ණ ලියා හල අගය** | 256,076,582.10 | - | - | - | 267,234,317.20 |

## කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

**ගිණුම් සඳහා සටහන්**

| | **මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා** | | **2014** | **2013** |
|---|---|---|---|---|
| | *වටිනාකම් රුපියල් වලින්* | **සටහන්** | | |
| **19** | **තොගය** | | | |
| | තොග - පාරිභෝජන අමුද්‍රව්‍ය | | 21,831,330.13 | 13,750,601.82 |
| | තොග - මිනිරන් | | 83,435,985.43 | 121,764,354.37 |
| | | | **105,267,315.56** | **135,514,956.19** |
| **20** | **ණය ගැතියෝ, තැන්පතු සහ ලැබිය යුතු දෑ** | | | |
| | ලැබිය යුතු ගිණුම් | | 7,867,148.55 | 14,254,647.59 |
| | අත්තිකාරම් | | 18,501.93 | 2,716.00 |
| | තැන්පතු | | 313,908.16 | 102,433.16 |
| | උත්සව අත්තිකාරම් | | - | 1,250.00 |
| | ශ්‍රී ලංකා ටෙලිකොම් තැන්පතු | | 5,000.00 | 5,000.00 |
| | ලැබිය යුතු වැට් | | 642,910.97 | 11,817,972.50 |
| | මිලදී ගැනීම් අත්තිකාරම් | | 15,000.00 | 737,727.30 |
| | කලින් ගෙවූ බදු කුලිය | | 1,026,800.00 | 976,800.00 |
| | අයකර ගත යුතු උපයන විට ගෙවීම් බදු | | - | 157,592.00 |
| | | | **9,889,269.61** | **28,056,138.55** |
| **21** | **මුදල් සහ මුදල් සමාන දේවල්** | | | |
| | ලංකා බැංකුව - රිදීගම | | 188,364.93 | 1,318,827.68 |
| | ලංකා බැංකුව - කොල්ලුපිටිය | | 36,788.44 | 958,588.52 |
| | වාසික විදේශ ව්‍යවහාර ඩොලර් ගිණුම, ලංකා බැංකුව - කොල්ලුපිටිය | | 13,541,287.38 | 9,416,114.23 |
| | සුළු මුදල් - ප්‍රධාන කාර්යාලය | | 23,398.76 | 3,791.82 |
| | සුළු මුදල් - පතල් කාර්යාලය | | 10,419.78 | 12,132.38 |
| | | | **13,800,259.29** | **11,709,454.63** |
| **22** | **ප්‍රකාශිත ප්‍රාග්ධනය** | | | |
| | ඇරයුු කොටස් ප්‍රාග්ධනය | | 13,000,000.00 | 13,000,000.00 |
| | | | **13,000,000.00** | **13,000,000.00** |
| **23** | **සංචිත** | | | |
| | ප්‍රත්‍යාගණන සංචිත | | 237,113,746.70 | 237,113,746.70 |
| | ප්‍රාග්ධන සංචිත | | 10,381,587.00 | 10,381,587.00 |
| | පිනිමෝ කොනියෝසිස් කම්පනි සංචිත | | 2,725,129.00 | 2,725,129.00 |
| | | | **250,220,462.70** | **250,220,462.70** |
| **24** | **වාරික ණය සහ බැංකු අයිරාව** | | | |
| | වාරික ණය | **24-01** | - | 2,500,000.00 |
| | | | **-** | **2,500,000.00** |
| | **බැංකු ණය** | **24-01** | | |
| | **මහජන බැංකු ණය** | | | |
| | 2013/04/01 ට ශේෂය | | 2,500,000.00 | 8,500,000.00 |
| | නැවත ගෙවීම් | | (2,500,000.00) | (6,000,000.00) |
| | 2014/03/31 ට ශේෂය | | **-** | **2,500,000.00** |
| | **භාණ්ඩාගාර ක්ෂය වීම් ණය** | | | |
| | 2013/04/01 ට ශේෂය | | - | - |
| | නැවත ගෙවීම් | | - | - |
| | 2014/03/31 ට ශේෂය | | **-** | **-** |
| | | | **-** | **2,500,000.00** |

# කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

## ගිණුම් සඳහා සටහන්

**25** **කල් බදු ණය හිමියෝ**

| ගිණුම් අංකය | ලංකා බැංකුව | | | |
|---|---|---|---|---|
| වාහන අංකය | **කේ එම් 3311** | **පී බී 9721** | **කේ එම් 3641** | **එකතුව** |
| වාරිකයක වටිනාකම | 124,847.00 | 100,598.00 | 105,403.00 | |
| බදු කාලය (මාස) | 60 | 60 | 60 | |
| එකතුව | 7,490,820.00 | 6,035,880.00 | 6,324,180.00 | 19,850,880.00 |
| පිරිවැය | 6,100,000.00 | 5,130,000.00 | 5,150,000.00 | 16,380,000.00 |
| පොලිය | 1,390,820.00 | 905,880.00 | 1,174,180.00 | 3,470,880.00 |
| **එකතුව** | | | | |
| ආරම්භක ශේෂය | 3,870,257.00 | 3,118,538.00 | 3,267,493.00 | 10,256,288.00 |
| ගෙවීම් 2014 | (1,498,164.00) | (1,207,176.00) | (1,264,836.00) | (3,970,176.00) |
| ශේෂය | **2,372,093.00** | **1,911,362.00** | **2,002,657.00** | **6,286,112.00** |
| දිගු කාලීන | 873,929.00 | 704,186.00 | 737,821.00 | 2,315,936.00 |
| කෙටි කාලීන | 1,498,164.00 | 1,207,176.00 | 1,264,836.00 | 3,970,176.00 |
| ශේෂය | 2,372,093.00 | 1,911,362.00 | 2,002,657.00 | **6,286,112.00** |
| **අවිනිශ්චිත පොලිය** | | | | |
| ආරම්භක පොලිය | 376,965.42 | 245,528.13 | 318,247.69 | 940,741.25 |
| ආදායම් ගිණුම | (323,563.34) | (151,475.02) | (196,338.30) | (671,376.65) |
| ශේෂය | 53,402.08 | 94,053.11 | 121,909.40 | **269,364.59** |
| ශේෂය | | | | |
| දිගු කාලීන | 7,869.78 | 13,860.46 | 17,965.60 | 39,695.83 |
| කෙටි කාලීන | 45,532.30 | 80,192.66 | 103,943.80 | 229,668.76 |
| එකතුව | 53,402.08 | 94,053.11 | 121,909.40 | **269,364.59** |
| ශේෂය | | | | |
| දිගු කාලීන | 943,648.69 | 690,325.54 | 719,855.40 | 2,353,829.64 |
| කෙටි කාලීන | 1,375,042.23 | 1,126,983.34 | 1,160,892.20 | 3,662,917.77 |
| එකතුව | **2,318,690.92** | **1,817,308.89** | **1,880,747.60** | **6,016,747.41** |

# කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

## ගිණුම් සඳහා සටහන්

| **මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා** *වටිනාකම් රුපියල් වලින්* **සටහන්** | | **2014** | **2013** |
|---|---|---|---|
| **26** | **වෙළඳ සහ අනෙකුත් ණය හිමියෝ** | | |
| | දිසානායක හාඩ්වෙයාර් | 9,880.50 | 585,346.50 |
| | ජයමිණි කන්ස්ට්‍රක්ෂන් | 278,805.00 | 18,000.00 |
| | විවිධ සේවා සමුපකාර සමිතිය - රිදීගම | 48,008.00 | 12,975.00 |
| | රෝච් ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ් | 170,700.00 | 283,800.00 |
| | සොලෙක්ස් ඉංජිනියරින් | 24,480.00 | 189,964.80 |
| | ස්පීඩ්වේ ෆෝවර්ඩ් | 57,805.77 | 12,780.77 |
| | ස්ටැෆර්ඩ් මෝටර්ස් කම්පනි | 24,572.00 | 9,991.60 |
| | එයාර් ලයින් ට්‍රේඩ(ර්)ස් | (9,700.00) | - |
| | ඇමරිකන් ප්‍රීමියම් වෝටර් සිස්ටම් (ප්‍රයිවට්) ලිමිටඩ් | 2,065.50 | - |
| | ෆාස්ට් ප්‍රින්ටින් (ප්‍රයිවට්) ලිමිටඩ් | 3,831.12 | - |
| | හෙලීක්ස් ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ් | 42,771.46 | - |
| | අයි ඩී ගාමිණී ජයසූරිය | 5,000.00 | - |
| | ඉන්ඩස්ට්‍රියල් ටෙක්නොලොජි ඉන්ස්ටියුට් | 5,000.00 | - |
| | ලංකා අයි බී සී කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් | 92,682.50 | - |
| | එල් ඩී ජේ එම් පී නානායක්කාර | 37,500.00 | - |
| | නිව් ෂයින් ජෙටරියල් ඇන්ඩ් මෙයින්ටෙයින්ස් සර්විස් | 8,600.00 | - |
| | ඩබ් ඩී එස් ටී ජයරත්න | 684.00 | - |
| | වෙල්කම් ප්‍රින්ටර්ස් ඇන්ඩ් ඇඩ්වර්ටයිසින් සර්විස් | 56,880.00 | - |
| | සිනෙත් ඉංජිනියරින් | 59,500.00 | - |
| | කොලෝනියල් හාඩ්වෙයාර් ස්ටෝර්ස් | - | 45,000.00 |
| | ඉලෙක්ට්‍රෝ රෙෆ් ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ් | - | 19,916.95 |
| | ඉබ්බාගමුව ෆාමසි | - | 1,304.00 |
| | මොඩ(ර්)න් හාඩ්වෙයාර් සෙන්ටර් | - | 76,750.00 |
| | එන් ඩී ඕ ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | - | 3,847.20 |
| | රූෆ් මාර්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | - | 3,571.43 |
| | සමෝටා ට්‍රේඩ් සෙන්ටර් | - | 19,750.00 |
| | වයඹ ග්‍රාමීය සමුපකාර බැංකු සංගමය | - | 5,950.00 |
| | ඇක්සෝෆ්ට් සොලියුෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් | - | 48,500.00 |
| | | **919,065.85** | **1,337,448.25** |
| **27** | **ගෙවිය යුතු ලාභාංශ** | | |
| | ආරම්භක ශේෂය | 3,702,986.65 | 3,702,986.65 |
| | ගෙවූ ලාභාංශ | (3,702,986.65) | - |
| | 2013/14 වසර සඳහා ලාභාංශ ප්‍රකාශ කිරීම | 954,196.07 | - |
| | | **954,196.07** | **3,702,986.65** |

## කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

**ගිණුම් සඳහා සටහන්**

| **මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා** *වටිනාකම් රුපියල් වලින්* | සටහන් | **2014** | **2013** |
|---|---|---|---|
| **28 බදු සඳහා ප්‍රතිපාදන** | | | |
| ආරම්භක ශේෂය | | 12,376,561.15 | 11,523,573.50 |
| ආදායම් බදු වෙනුවෙන් හිලව් කල එකතු කල අගය මත බදු | | (6,420,788.20) | - |
| ආදායම් බදු අඩුවෙන් ප්‍රතිපාදනය කිරීම | | 4,041,364.45 | - |
| ගෙවිය යුතු ලාභාංශ බදු | | 106,021.79 | - |
| වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බදු | | 4,581,762.69 | 852,987.65 |
| රඳවා ගැනීමේ බදු | | (75,000.00) | - |
| | | **14,609,921.88** | **12,376,561.15** |
| **29 උපචිත ගාස්තු** | | | |
| එස් ඉන්ට(ර්)නැෂනල් එක්ස්ප්‍රස් (ප්‍රයිවට්) ලිමිටඩ් | | 10,268.20 | 2,539.16 |
| විගණන ගාස්තු - රණවීර, නාගසිංහ සහ සමාගම | | 257,500.00 | 164,696.00 |
| ගෙවිය යුතු සේ. භා. අ. | | 101,282.13 | 95,200.88 |
| ගෙවිය යුතු සේ. අ. අ. | | 742,662.98 | 698,067.79 |
| ලංකා විදුලිබල මණ්ඩලය | | 1,211,780.56 | 1,054,862.65 |
| ලේඩි ලෝහෝර් ආර්යා ණය අරමුදල | | 234,300.00 | 325,600.00 |
| උපයන විට ගෙවීමේ බද්ද | | 30,000.00 | 69,600.00 |
| ගෙවිය යුතු වැටුප් සහ වේතන ගිණුම | | 3,189,507.82 | 3,260,758.77 |
| ෂෙහානි එන්ටර්ප්‍රයිසස් - කුරුණෑගල | | 7,975.00 | 7,975.00 |
| ගෙවිය යුතු දුරකථන බිල් | | 30,804.93 | 38,710.07 |
| විජිලන්ට් ආරක්ෂක සේවය | | 59,311.86 | 931,505.64 |
| ඇල්ෆෙක්ස් නෙට්වර්ක් ආරක්ෂක සේවය | | 823,901.92 | - |
| ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය | | 1,086.80 | - |
| ගෙවිය යුතු NBT/VAT | | - | 13,752.06 |
| | | **6,700,382.20** | **6,663,268.02** |

# බදුකරණය සඳහා සටහන්

2013/2014 ගිණුම් වර්ෂය සඳහා මුල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී ශ්‍රී ලංකා මුල්‍ය වාර්තාකරණ ප්‍රමිතින් (එස් එල් එෆ් ආර් එස්) ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත (එල් කේ ඒ එස්) ඇතුලත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කිරිම නිසා වන බලපෑම් ආදායම් බදු පනතේ විධිවිධාන වලට අනුකූලව හා අංක 1857/8 අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කර ඇත.

| *අංක* | *අනුගමනය කල ගිණුම්කරණ ප්‍රමිත* | **බදුකරණය සඳහා ඉල්ලා ඇති අනුගමනය කල යුතු ගැලපුම් / තොරතුරු** |
|---|---|---|
| **1.0** | ශ්‍රී ලංකා වාර්තාකරණ ප්‍රමිත ප්‍රථම වතාවට යොදා ගැනීම (එස් එල් එෆ් ආර් එස් ) | • ආයතනය වත්කම් ප්‍රත්‍යාගණනයක් 2012/04/31 සහ තොග අගය කිරීමක් 2013/04/01 කර ඇති අතර බදුකරණ කටයුතු සඳහා ගැලපුම් කර නැත. |
| **2.0** | තොග (එල් කේ ඒ එස් 2) | • කිසිදු තොගයක් (උදා : ලැබිය යුතු ඇසුරුම් ද්‍රව්‍ය ) ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත අනුව (එල් කේ එස්) අනුගමනය කිරීමේ දී ජංගම නොවන වත්කම් වශයෙන් වර්ගීකරණය කර නැති අතර පවත්නා බදුකරණ භාවිතයන්ට අනුව තොග වශයෙන් සලකා පවත්වාගෙන යයි. |
| **3.0** | ඉදිකිරීමේ කොන්ත්‍රාත් ( එල් කේ ඒ එස් 11) | • මෙම ආයතනය සඳහා අදාල නැත. |
| **4.0** | ආදායම් බදු ( එල් කේ ඒ එස් 12) | • මෙම ආයතනය සඳහා අදාල නැත. |
| **5.0** | දේපල පිරියත හා උපකරණ (පි පි ඊ) (එල් කේ ඒ එස් 16) | • මෙම ආයතනය සඳහා ආදාල නැත. |
| **6.0** | කල් බදු (එල් කේ ඒ එස් 17) | • ගිණුම් වල සටහන් අංක 25 දක්වා ඇති පරිදි |
| **7.0** | ආදායම | • ආයතනයේ සියලුම මෙහෙයුම් ආදායම බදුකරණ කටයුතු සඳහා සැලකිල්ලට ගෙන ඇත. |

| | | |
|---|---|---|
| 8.0 | සේවක ප්‍රතිලාභ (එල්. කේ. ඒ. එස්. 19) | • ලාභාංශ සඳහා හවුල්කර ගැනීමේ කිසිදු සැලැස්මක් නොමැත.<br>• ආයතනයේ සේවකයින්ට ලබා දුන් ණය මුදල් මත කිසිදු පොලී ගණනය කිරීමක් සිදු කර නොමැත. එම නිසා බදුකරණය සඳහා කිසිදු ගැලපීමක් සිදු කර නොමැත.<br>. ආයතනයේ සේවකයින් සඳහා ප්‍රසාද වශයෙන් භාණ්ඩ හෝ සේවා ලබාදීම නියමිත මිලට වඩා අඩුවෙන් භාණ්ඩ ලබා දීම පදනම මත කිසිදු ප්‍රතිලාභයක් ලබා දී නොමැත. |
| 9.0 | රාජ්‍ය ප්‍රදාන හා සහනාධාර<br>(එල් කේ ඒ එස් 20) | • මෙම වර්ෂය සඳහා අදාල නැත. |
| 10.0 | විදේශ විනිමය අනුපාත බලපෑම<br>(එල් කේ ඒ එස් 21) | • වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ දක්වා ඇත. |
| 11.0 | ණයට ගැණුම් පිරිවැය (එල් කේ ඒ එස් 23) | • මෙම ආයතනය සඳහා අදාල නැත |
| 12.0 | විශ්‍රාමික ප්‍රතිලාභ අරමුදල් හෝ සැලසුම්<br>(එල් කේ ඒ එස් 26) | • වෙනත් විස්තීර්ණ ආදායමට දිර්ඝකාලීන ප්‍රතිලාභ හෝ අලාභ වගකීම් ගෙන නැත. |
| 13.0 | වත්කම් වල අගය අඩු වීම<br>(එල් කේ ඒ එස් 36) | • හානිවීමේ පාඩු හා වගකීම වෙනස් වීම මත ප්‍රතිලාභ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ දක්වා නැත. |
| 14.0 | දේපල ආයෝජන | • මෙම ආයතනය සඳහා අදාල නැත. |
| 15.0 | කොටස් පදනම මත ගෙවීම<br>(එස් එල් එෆ් ආර් එස් 2) | • මෙම ආයතනය සඳහා අදාල නැත. |
| 16.0 | ව්‍යාපාර සංයෝජන (එස් එල් එෆ් ආර් එස් 3) | • මෙම ආයතනය සඳහා අදාල නැත. |
| 17.0 | ජංගම නොවන වත්කම් විකුණුම් සඳහා හා අත්හිටවූ ක්‍රියාකාරකම්<br>(එස් එල් එෆ් ආර් එස් 5) | • මෙම ආයතනය සඳහා අදාල නැත. |
| 18.0 | ගණුදෙනු කල හැකි ලියවිලි (එස් එල් එෆ් ආර් එස් 7, එස් එල් එෆ් ආර් එස් 9, එල් කේ ඒ එස් 32 හා එල් කේ ඒ එස් 39) | • මෙම ආයතනය සඳහා අදාල නැත. |

**කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්**

**ආදායම් බදු ගණනය කිරීම**

**තක්සේරු කිරීමේ වසර 2013/14**

| | | | | |
|---|---|---|---|---|
| **ගිණුම් වලට අනුව ලාභය / (අලාභය)** | | | | 21,187,780.68 |
| අඩු කලා : රාජ්‍ය ප්‍රදාන | | | | - |
| | | | | 21,187,780.68 |
| **යලි එකතු කිරීම්:** | | | | |
| පාරිතෝෂික ප්‍රතිපාදන | | | 2,229,903.20 | |
| නීති ගාස්තු | | | 103,697.65 | |
| සංග්‍රහ | | | 472,753.57 | |
| ක්ෂය වීම් | | | 20,167,747.60 | |
| විකුණුම් ප්‍රවර්ධන | 897,096.70 | 25% | 224,274.18 | |
| ප්‍රචාරණ | 854,180.00 | 25% | 213,545.00 | |
| හිමිකම් ඉල්ලිය නොහැකි කල් බදු වල වැට් | | | 331,560.00 | |
| කල් බදු පොලි ගාස්තු | | | 671,376.66 | |
| ප්‍රතික්ෂේප කල එකතු කල අගය මත බදු | | | 5,970,583.50 | |
| සී එස් ආර් සමාජ සත්කාර වියදම් | | | 1,252,251.00 | 31,637,692.36 |
| | | | | **52,825,473.04** |
| **අඩු කලා :** | | | | |
| ප්‍රාග්ධන දීමනා | සටහන 01 | | | (7,460,317.75) |
| කල්බදු වාරික ගෙවීම් මත දීමනා | සටහන 02 | | | (1,207,176.00) |
| පාරිතෝෂික ගෙවීම් වර්ෂය සඳහා | | | | (914,996.00) |
| පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා ප්‍රාග්ධන දීමනා | | | | (3,119,382.14) |
| විදේශ විනිමයේ ලාභය / පාඩුව | | | | (1,942,245.39) |
| | | | | (14,644,117.28) |
| **වර්ෂය සඳහා ලාභය** | | | | **38,181,355.76** |
| බදු අය කල හැකි ලාභය | | | | 38,181,355.76 |
| ගෙවිය යුතු බද්ද | | 12% | | 4,581,762.69 |

**ගෙවිය යුතු ලාභාංශ බදු**

| | |
|---|---|
| බදු පසු ශුද්ධ ලාභය | 16,606,017.99 |
| අඩු කලා : අත්පත් කර ගත් දේපල, පිරියත සහ උපකරණ | (6,708,810.06) |
| එකතු කලා : අත්පත් කර ගත් දේපල, යන්ත්‍ර උපකරණ මත ක්ෂය වීම | 704,970.63 |
| බෙදා හැරිය යුතු ලාභය | 10,602,178.56 |
| ගෙවිය යුතු ලාභාංශ | 1,060,217.86 |
| ගෙවිය යුතු ලාභාංශ බදු | 106,021.79 |
| ගෙවීමට ඇති ශුද්ධ අගය | 954,196.07 |

කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

ආදායම් බදු ගණනය කිරීම
තක්සේරු කිරීමේ වසර **2013/14**

**01** සටහන **:** වත්කම් මත ප්‍රාග්ධන දීමනා

| වත්කම් | හිමිකම් අංකය | | අනුපාතිකය | වටිනාකම | හිමිකම |
|---|---|---|---|---|---|
| ගොඩනැගිලි | | | | | |
| 2011/12 | 03 | | 10% | 1,422,820.50 | 142,282.05 |
| 2012/13 | 02 | | 10% | 4,554,425.27 | 455,442.53 |
| 2013/14 | 01 | | 10% | 178,545.08 | 17,854.51 |
| විදුලි උපකරණ | | | | | |
| 2008/09 | 05 | | 12.5% | 10,780.00 | 1,347.50 |
| 2010/11 | 04 | | 12.5% | 446,810.00 | 55,851.25 |
| 2011/12 | 03 | | 25.0% | 43,350.00 | 10,837.50 |
| 2012/13 | 02 | | 25.0% | 868,548.00 | 217,137.00 |
| 2013/14 | 01 | | 33.3% | 5,500.00 | 1,833.15 |
| වෙනත් වත්කම් | | | | | |
| 2008/09 | 05 | | 20% | 166,950.00 | 33,390.00 |
| 2010/11 | 04 | | 20% | 91,800.00 | 18,360.00 |
| 2011/12 | 03 | | 20% | 98,215.00 | 19,643.00 |
| 2012/13 | 02 | | 20% | 357,100.00 | 71,420.00 |
| 2013/14 | 01 | | 6.66% | 3,918,615.00 | 260,979.76 |
| කාර්යාලයීය උපකරණ | | | | | |
| 2008/09 | 05 | | 12.5% | 175,855.00 | 21,981.88 |
| 2009/10 | 05 | | 12.5% | 181,927.67 | 22,740.96 |
| 2010/11 | 04 | | 12.5% | 739,029.48 | 92,378.69 |
| 2011/12 | 03 | | 20.0% | 439,580.58 | 87,916.12 |
| 2012/13 | 02 | | 20.0% | 560,021.55 | 112,004.31 |
| 2013/14 | 01 | | 20.0% | 187,396.25 | 37,479.25 |
| 2013/14 | 01 | | 25.0% | 148,000.00 | 37,000.00 |
| විදුලි ජනකය | | | | | |
| 2008/09 | 05 | | 12.5% | 12,528,342.00 | 1,566,042.75 |
| 2009/10 | 05 | | 12.5% | 794,707.00 | 99,338.38 |
| පිරියත සහ යන්ත්‍ර සූත්‍ර | | | | | |
| 2010/11 | 04 | | 12.5% | 3,476,500.00 | 434,562.50 |
| 2011/12 | 03 | | 33.3% | 2,602,731.41 | 867,490.38 |
| 2012/13 | 02 | | 33.3% | 6,403,622.68 | 2,134,327.44 |
| 2013/14 | 01 | | 50.0% | 621,753.73 | 310,876.87 |
| මෝටර් වාහන | | | | | |
| 2013/14 | 01 | | 20% | 1,649,000.00 | 329,800.00 |
| | | | | | 7,460,317.75 |
| සටහන **02:** කල් බදු වාරික මත | | | | | |
| **PB9721** | | | | | |
| කල්බදු දීමනා | 03 | 6,035,880.00 | 20% | 1,207,176.00 | |
| ගෙවූ කුලිය | | | | 1,207,176.00 | 1,207,176.00 |
| | | | | | **1,207,176.00** |

# දැන්වීම
# කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

'කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්' හි වාර්ෂික මහා සභා රැස්වීම 2014 සැප්තැම්බර් 26 වැනි දින ප.ව 2.00 ට කොළඹ 02, සර් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවතේ, අංක 100-1/3 දරණ ස්ථානයේ පිහිටි ලේඩි ලාහෝර් අරමුදල් ගොඩනැගිල්ලෙහි පළමු මහලෙහි කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල කාමරයේදී පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

==========================================================

න්‍යාය පත්‍රය

**1** <u>දැන්වීම</u>

රැස්වීම කැඳවීමේ දැන්වීම ලැබීම

**2** <u>අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව, විගණනය කරන ලද ගිණුම් සහ විගණන වාර්තා</u>

2014 මාර්තු 31 දිනට අවසන් වර්ෂය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව, විගණනය කරන ලද ගිණුම් සහ විගණකවරුන්ගේ වාර්තාව ලැබීම සහ සලකා බැලීම.

**3** <u>අධ්‍යක්ෂවරුන් නැවත පත් කිරීම</u>

**a) ටී. එම්. ඒ. බන්සජයා මහතා**

සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියෙහි වක්‍රීයකරණය අනුව ටී. එම්. ඒ. බන්සජයා මහතා නැවත පත් කිරීම.

**b) ඒ. යූ. එම්. යසීර් මහතා**

සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියෙහි වක්‍රීයකරණය අනුව ඒ. යූ. එම්. යසීර් මහතා නැවත පත් කිරීම.

**c) එම්. එස්. එල්. අලීඛාන් මහතා**

සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියෙහි වක්‍රීයකරණය අනුව එම්. එස්. එල්. අලීඛාන් මහතා අධ්‍යක්ෂවරයෙක් ලෙස පත් කිරීම.

**4** <u>ලාභාංශ ප්‍රකාශයට පත් කිරීම</u>

2014 මාර්තු 31 දිනට අවසන් වර්ෂය සඳහා අවසාන ලාභාංශය රුපියල් 1,060,217.86 ක් බව ප්‍රකාශ කිරීම

**5** <u>විගණකවරුන් නැවත පත් කිරීම</u>

ඊළග වර්ෂය සඳහා, සමාගමේ විගණකවරුන් වශයෙන් නාගසිංහ සහ සමාගම, වරලත් ගණකාධිකාරීන් නැවත පත් කිරීම සහ ඔවුනගේ ගෙවීම් පිළිබඳව අධ්‍යක්ෂවරුන්ට බලය ලබා දීම.

**6** පුණ්‍යාධාර කටයුතු සඳහා දායක මුදල් ගෙවීමට අධ්‍යක්ෂවරුනට බලය ලබා දීම.

**7** දැනුම් දී ඇති වෙනත් කරුණු

**අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි**
**කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්**

**ලේකම්වරු එකවුන්ටිං සිස්ටම්ස් සෙක්‍රිටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්**
**04.08.2014**

# කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

# අංක 100-1/3, සර් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

## පෙරකලාසි ආකෘති පත්‍රය

මෙහි අත්සන් කරන, භාණ්ඩාගාරයේ ලේකම් වන මා, කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගමේ සමාජිකයෙකු වශයෙන්, 2014 සැප්තැම්බර් 26 වැනි දින පැවැත්වීමට නියමිත, සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීමේදී සහ එහි යම් අදාලව කල්තැබීමකදී සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් තිබිය හැකි සෑම ඡන්ද විමසීමකදී, මාගේ ප්‍රතියුත්තයා වශයෙන් මා නියෝජනය කිරීමට සහ මා වෙනුවෙන් යෝජනා සඳහා / හෝ එරෙහිව ඡන්දය ප්‍රකාශ කිරීමට සහ / හෝ කථා කිරීමට………………………………(ලිපිනය) පදිංචි ……………………………… (නම) මහතා මෙයින් පත් කරමි.

| | | සඳහා | එරෙහිව |
|---|---|---|---|
| 1 | 2014 මාර්තු 31 වන දිනට අවසන් වර්ෂය සඳහා විගණන ගිණුම් වාර්තා අනුමත කිරීමට | ☐ | ☐ |
| 2 | ඒ. යූ. එම්. යසීර් මහතා සමාගමේ අධක්ෂවරයෙකු වශයෙන් නැවත පත් කිරීමට | ☐ | ☐ |
| 3 | ටී. එම්. ඒ. බන්සජයා මහතා සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් නැවත පත් කිරීමට | ☐ | ☐ |
| 4 | එම්. එස්. එල්. අලීබාන් මහතා සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් නැවත පත් කිරීමට | ☐ | ☐ |
| 5 | 2014 මාර්තු 31 දිනට අවසන් වර්ෂය සඳහා අවසාන ලාභාංශය රුපියල් 1,060,217.86 ක් බව ප්‍රකාශ කිරීම | ☐ | ☐ |
| 6 | සමාගමේ විගණකවරු වශයෙන් වරලත් ගණකාධිකාරීවරුන් වන නාගසිංහ සහ සමාගම නැවත පත් කිරීමට | ☐ | ☐ |
| 7 | පුණ්‍යාධාර කටයුතු සඳහා දායක මුදල් ගෙවීමට අධ්‍යක්ෂවරුන්ට බලය ලබා දීමට | ☐ | ☐ |
| 8 | දැනුම් දී ඇති වෙනත් කාරණා පිළිබඳව අනුමැතිය දීමට | ☐ | ☐ |

……………………………………………

කොටස් හිමිකරු

2014 …………..…………වැනි දින අත්සන් තබන ලදී.